# කාර්යය සාධන වාර්තාව
# செயலாற்றறிக்கை
# Performance Report
# 2017



**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

**கடற்றொழில், நீரியல் வளத்துறை திணைக்களம்**

**Department of Fisheries & Aquatic Resources**

# පටුන


| | පිටු අංක |
|---|---|
| පෙරවදන | ii |
| 01. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 01 - 06 |
| 02. ධීවර කළමනාකරණ අංශය | 07 - 12 |
| 03. ධීවර කර්මාන්ත අංශය | 13 - 18 |
| 04. ධීවර තත්ත්ව පාලන අංශය | 19 - 21 |
| 05. අධීක්ෂණය, පාලනය හා සෝදිසි මෙහෙයුම් අංශය | 22 - 24 |
| 06. අන්තර් ජාතික ධීවර කටයුතු අංශය | 25 - 29 |
| 07. යාත්‍රා නිරීක්ෂණ අංශය | 30 - 33 |
| 08. කිවුල්දිය ධීවර කළමණාකරණ අංශය | 34 - 41 |
| 09. පාලන අංශය | 42- 52 |
| 10. මූල්‍ය අංශය | 53 - 57 |
| 11. අභ්‍යන්තර විගණන අංශය | 58 - 60 |

# පෙරවදන

ධීවර ඇණිය සහ යෙදවුම් කළමනාකරණය තුලින් පුනර්ජනනීය නමුත් සීමිත වන ධීවර හා ජලජ සම්පත් අනාගත පරපුර වෙනුවෙන් රැකගැනීම හා නියාමනය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වී ඇත.

ජාත්‍යන්තර සම්මතයන් හා නීතිරීතිවලට එකඟව වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් කරා ධීවර ප්‍රජාව යොමු කිරීම සඳහා නෛතික රාමුව ශක්තිමත් කිරීම, පුහුණුව හා දැනුවත් කිරීම මගින් අනුකූලතාවය වර්ධනය, යාත්‍රා නිරීක්ෂණය මගින් මහ මුහුදේ යාත්‍රා මෙහෙයවීම හා ධීවර වරායන්හි ක්‍රියාවලිය මගින් මසුන් ඇල්ලීම සහතිකකරණය 2017 වසර තුලදී දෙපාර්තමේන්තුව ගෙන ඇති ඵලදායී පියවරයන් වේ.

එසේම මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිත බව හා ගුණාත්මකභාවය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහතිකකරණය නිසා 2017 වර්ෂයේ මත්ස්‍ය අපනයන අවස්ථා යුරෝපා සංගමය මෙන්ම ඇමරිකාව, චීනය, රුසියාව, කැනඩාව හා මැදපෙරදිග රටවල් කරා ද පුලුල් කරගත හැකිවීම ජාතික මට්ටමින් දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි.

තවද සෑම ධීවර කාර්මිකයෙකු සඳහාම රුපියල් මිලියනයක රක්ෂණාවරණයක් ලබා දීම, විසිහතර පැය ගුවන් විදුලි සම්ප්‍රේෂණ සම්බන්ධතාවය පවත්වාගෙන යාම සහ වැවක්/කළපුවක් සමග ගමක් වැඩසටහන මගින් නිවාස, සනීපාරක්ෂක, ආදායම් උත්පාදන හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ධීවර ප්‍රජාවගේ ආර්ථික සුරක්ෂිතතාවය තහවුරු කිරීමට 2017 වර්ෂයේ දෙපාර්තමේන්තුව සමත්වී ඇත.

එසේම නවීන තාක්ෂණික උපාංග වලින් සමන්විත අඩි 55 ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනයට හා ධීවර යාත්‍රා වල නවීන තාක්ෂණය වැඩිදියුණු කිරීමට 50% ක රජයේ සහනාධාරය ලබා දීම තුලින් තත්ත්වයෙන් උසස් මත්ස්‍ය අස්වනු නෙලීම සඳහා හැකියාව වර්ධනය කර ධීවර කාර්මිකයාගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට 2017 වසර තුලදී දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

මේ අතර ජීව විද්‍යා උපාධිධාරීන්, නාවික හා ගුවන් විදුලි තාක්ෂණඥයින් ආකර්ෂණය කර ගැනීම හා රඳවා ගැනීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇති බවද සඳහන් කළ යුතුය.

ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර

අධ්‍යක්ෂ ජනරාල්

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,

නව මහලේකම් කාර්යාලය,

කොළඹ 10.

2018.08.15

# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

## 1.1. මෙහෙවර

නව තාක්ෂණය යොදා ගනිමින් ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව සම්පත් කළමනාකරණය තුලින් ශ්‍රීලංකා ජාතික ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීම සඳහා ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීම.

## 1.2. පරමාර්ථ

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමණාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය.
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරිම.

## 1.3. උපාය මාර්ග

- 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර අංශ සංවර්ධනයට දේශීය හා විදේශීය ව්‍යාපාර ප්‍රජාවගේ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ධීවර කර්මාන්තය සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වාදීමට අනුගත ආයතන සමග විධිමත් සම්බන්ධීකරණය.
- දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන්, ප්‍රජා සංවර්ධන වැඩසටහන්, විද්‍යාත්මක සොයාගැනීම් සහ පර්යේෂණ ප්‍රතිඵල, නව තොරතුරු තාක්ෂණය උපයෝගී කරගෙන ක්‍රමවත් ව්‍යාප්ති සේවාවක් තුළින් ධීවර ප්‍රජාව වෙත ගෙන යාම.
- ධීවර සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති සහ සම්පත් කළමනාකරණයේදී ධීවර ප්‍රජා සහභාගීත්වයට ප්‍රමුඛතාවක් ලබාදීම සහ ඒ සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන සහ ප්‍රජා සංවිධානවල දායකත්වය ලබාගැනීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීමට හා අපනයන සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා පුහුණුව ලබාදීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.
- ධීවර කුටුම්භයන්හි සමාජ තත්ත්වය නංවාලීම සඳහා ධීවරයින්ගේ සහ ධීවර කාන්තාවන්ගේ පූර්ණ දායකත්වය ලබා ගැනීමට අවශ්‍ය දිරිගැන්වීම් සැපයීම.

## 1.4. කාර්යභාරය

- ධීවර මෙහෙයුම් නියෝග, ධීවර කළමනාකරණ නියෝග, ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- ධිවර යාත්‍රා උකස් කිරීම පිළිබඳ කටයුතු.
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධිවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත් නිකුත් කිරීම.
- ධිවර කළමනාකරණය පිළිබඳ දැනුවත් භාවය වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය.
- ධීවර යාත්‍රා නිෂ්පාදකයින්, ආම්පන්න නිෂ්පාදකයින් හා අලෙවි නියෝජිතයින් සහ යාත්‍රා එංජින් නියෝජිතයින් ලියාපදිංචි කිරීම.
- යාත්‍රා එංජින් සහ ආම්පන්නවල මිල ගණන් කැඳවා අනුමත කිරීම.
- ධිවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම හා ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීම.
- ජාතික ධිවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධිවර සංවිධාන සහ ධිවර සමුපකාර සමිති මගින් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා ජාතික මට්ටමින් සම්බන්ධීකරණය හා අධික්ෂණය.
- ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.
- ධීවර කර්මාන්තයට අදාල දත්ත රැස් කිරීම.
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන හා මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම සහ මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම, මත්ස්‍ය අපනයන සඳහා ස්වස්ථ සහතික නිකුත් කිරීම.
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළදාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම.

## 1.5. සංවිධාන ව්‍යුහය

ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 10 කට බෙදා තිබේ.

එනම්,

1. ධිවර කළමනාකරණ අංශය
2. ධිවර කර්මාන්ත අංශය
3. ධිවර නිෂ්පාදන තත්ත්ව පාලන අංශය
4. සෝදිසි මෙහෙයුම් අංශය
5. අන්තර් ජාතික ධීවර කටයුතු අංශය
6. යාත්‍රා නිරීක්ෂණ අංශය
7. කිවුල්දිය කළමනාකරණ අංශය
8. පාලන අංශය
9. මුල්‍ය කළමනාකරණ අංශය
10. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් පස්දෙනෙකු මගින් ඉටුවේ.

මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂ කාර්යාල 15ක් පිහිටුවා තිබෙන අතර එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ ඉටුවේ. දිස්ත්‍රික්ක තුළ මුහුදු බඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ133ක් පිහිටුවා ඇත. මෙම සෑම ධීවර පරීක්ෂක කොට්ඨාශයකම ධීවර කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර සහ සංවර්ධන නිළධාරී යන නිළධාරීන් විසින් ධීවර පරීක්ෂක කොට්ඨාශය තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම ධීවර වරායන් ආශ්‍රිතව සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 20 ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිළධාරීන් දිවා රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. ඊට අමතරව දිස්ත්‍රික්ක 07 ක පිහිටි ධීවර වරායන් 15 ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර පරීක්ෂක සහ සංවර්ධන නිළධාරී යන නිළධාරීන් විසින් දිවා රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරීක්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබාදීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාල ලොග් සටහන ලබා ගැනීම, ඒ අනුව මත්ස්‍ය අස්වැන්න පරීක්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබාදීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදුවී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම හා ලොග් සටහන් හා ලබාගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබාදීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

## 1.6. 2017 වර්ෂයේ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය දිස්ත්‍රික්ක වශයෙන්

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2017 වාර්ෂික ඉලක්කය මෙට්‍රික් ටොන් | 2017 වාර්ෂික ප්‍රගතිය මෙට්‍රික් ටොන් |
|---|---|---|---|
| 01 | කොළඹ | 6,792 | 7,104 |
| 02 | කළුතර | 35,315 | 40,556 |
| 03 | ගාල්ල | 45,550 | 48,526 |
| 04 | මාතර | 75,800 | 28,732 |
| 05 | තංගල්ල | 58,535 | 68,417 |
| 06 | කල්මුණේ | 26,937 | 20,081 |
| 07 | මඩකලපුව | 54,960 | 23,234 |
| 08 | ත්‍රිකුණාමලය | 74,840 | 32,657 |
| 09 | මුලතිව් | 14,500 | 5,370 |
| 10 | කිලිනොච්චි | 9,350 | 11,686 |
| 11 | යාපනය | 73,150 | 42,445 |
| 12 | මන්නාරම | 36,375 | 20,696 |
| 13 | පුත්තලම | 44,840 | 28,862 |
| 14 | මහවැව | 31,500 | 30,816 |
| 15 | මීගමුව | 72,156 | 100,665 |
| | **එකතුව** | **652,884** | **509,847** |

## 1.7. 2017 වර්ෂයේ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය වර්ග වශයෙන්

| මත්ස්‍ය වර්ගය | ප්‍රමාණය මෙට්‍රික් ටොන් |
|---|---|
| තෝරා | 7,790 |
| පරව් | 23,690 |
| බලයා | 57,960 |
| කෙලවල්ලා | 38,960 |
| අනෙකුත් ලේ මසුන් | 44,520 |
| තලපත් | 33,180 |
| මෝරා/මඩුවා | 13,620 |
| ගල් මාළු | 31,100 |
| මාදැල් මසුන් | 143,320 |
| ඉස්සන් | 17,620 |
| පොකිරිස්සන් | 540 |
| කකුළුවන් | 11,510 |
| වෙනත් | 25,700 |
| **එකතුව** | **449,440** |

## 1.8. 2017 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව දිවයිනේ ක්‍රියාත්මක ධීවර යාත්‍රා

| දිස්ත්‍රික්කය | ඇතුලත සවිකල එන්ජින් සහිත | | | පිටත සවිකල එන්ජින් සහිත | | යාන්ත්‍රික නොවන පාරම්පරික යාත්‍රා | මාදැල් බෝට්ටු |
|---|---|---|---|---|---|---|---|
| | බහුදින යාත්‍රා | | එක්දින යාත්‍රා | පයිබර් යාත්‍රා | පාරම්පරික යාත්‍රා | | |
| | අඩි 50 ට වැඩි | අඩි 50 ට අඩු | | | | | |
| 01.කොළඹ | 10 | 32 | 19 | 394 | 01 | 318 | 24 |
| 02.කළුතර | - | 391 | 01 | 392 | - | 345 | 44 |
| 03.ගාල්ල | - | 624 | 19 | 389 | 241 | 268 | 52 |
| 04.මාතර | - | 1,224 | 79 | 773 | 299 | 674 | 07 |
| 05.තංගල්ල | 02 | 567 | 22 | 699 | 125 | 610 | 69 |
| 06.කල්මුණේ | - | 111 | 78 | 806 | 198 | 1,040 | 167 |
| 07.මඩකලපුව | - | 374 | 28 | 1,387 | 07 | 4,893 | 168 |
| 08.ත්‍රිකුණාමලය | - | 124 | 15 | 2,965 | 23 | 1,636 | 191 |
| 09.මුලතිව් | - | - | - | 879 | - | 180 | 22 |
| 10.කිලිනොච්චිය | - | 02 | - | 689 | 91 | 215 | - |
| 11.යාපනය | - | 90 | 350 | 4,141 | 660 | 2,038 | 203 |
| 12.මන්නාරම | - | 34 | 208 | 2,728 | 442 | 839 | 14 |
| 13.පුත්තලම | 01 | 51 | - | 2,699 | 209 | 1,388 | 181 |
| 14.හලාවත | 08 | 495 | - | 1,841 | 09 | 1,437 | 08 |
| 15.මීගමුව | 05 | 353 | 58 | 1,650 | 02 | 1,437 | 05 |
| එකතුව | **26** | **4,472** | **877** | **22,432** | **2,307** | **16,423** | **1,155** |

## 1.9. 2017.12.31 දිනට දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තරය

| තනතුරු කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 2. අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී ලංකා පරිපාලන සේවය -1 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 3. අධ්‍යක්ෂ ( කළමනාකරණ) (දෙපාර්තමේන්තුමය - 1 ශ්‍රේණිය) | 01 | - | 01 |
| 4. අධ්‍යක්ෂ ( කර්මාන්ත) (දෙපාර්තමේන්තුමය -1 ශ්‍රේණිය) | 01 | - | 01 |
| 5. ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය -1 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 6. ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය -1 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 7. ගණකාධිකාරී සැපයීම් (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 1 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 8. නීති නිළධාරී (දෙපාර්තමේන්තුමය 1/ 11 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 9. නාවික ඉංජිනේරු (දෙපාර්තමේන්තුමය 1/ 11/111 ශ්‍රේණිය) | 01 | - | 01 |
| 10. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ( මත්ස්‍යජීව) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 11. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ( සමාජ ආර්ථික) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 12. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී ලංකා පරිපාලන සේවය -11/111 ශ්‍රේණිය) | 02 | 01 | 01 |
| 13. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 14. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ( කර්මාන්ත) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 02 | 02 | - |
| 15. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 02 | 02 | - |
| 16. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ( තාක්ෂණ) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 02 | - | 02 |
| 17. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ( දිස්ත්‍රික්) (දෙපාර්තමේන්තුමය 11/111 ශ්‍රේණිය) | 26 | 21 | 05 |
| 18. සිවිල් ඉංජිනේරු (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය -1/11/111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 19. ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 11/111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| 20. පරිපාලන නිළධාරී (ඒකාබද්ධ සේවය ) | 01 | 01 | - |
| 21. නාවික සමීක්ෂක (දෙපාර්තමේන්තුමය ) | 04 | - | 04 |
| 22. තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිළධාරී (ශ්‍රීලංකා තොරතුරු තාක්ෂණ සේවය ) | 02 | 03 | - |
| 23. භාෂා පරිවර්තක (ඒකාබද්ධ සේවය ) | 02 | 02 | - |
| 24. වැඩසටහන් කළමනාකරු (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 25. තත්ත්ව පාලන නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 10 | 06 | 04 |
| 26. වැඩසටහන් සහකාර (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 27. ධීවර සම්පත් කළමනාකරණ සහකාර (දෙපාර්තමේන්තුමය ) | 02 | 02 | - |

| තනතුරු කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 28. සංවර්ධන නිළධාරී (ඒකාබද්ධ සේවය ) | 284 | 225 | 59 |
| 29. ධීවර නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 225 | 78 | 147 |
| 30. අධීක්ෂන නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 12 | 03 | 09 |
| 31. තාක්ෂණ නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 02 | 01 | 01 |
| 32. සැළසුම් ශිල්පී (ශ්‍රීලංකා තාක්ෂණ සේවය ) | 01 | - | 01 |
| 33. ප්‍රවාහන නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 01 | - | 01 |
| 34. ප්‍රධාන ගුවන් විදුලි නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 35. ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 05 | 05 | - |
| 36. කණිෂ්ඨ ගුවන් විදුලි නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 62 | 45 | 17 |
| 37. නාවික ඉංජිනේරු සහකාර (ශ්‍රීලංකා තාක්ෂණ සේවය ) | 15 | 11 | 04 |
| 38. නාවික ඉංජිනේරු සහකාර (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 39. රාජ්‍ය කළමනාකරණ සහකාර (ඒකාබද්ධ සේවය ) | 143 | 107 | 36 |
| 40. තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රීලංකා තොරතුරු තාක්ෂණ සේවය ) | 02 | 02 | - |
| 41. වැඩ පරිපාලක (ශ්‍රීලංකා තාක්ෂණ සේවය ) | 01 | 01 | - |
| 42. ධීවර බලපත්‍ර නිළධාරී (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 43. ධීවර සමාජ සංවර්ධන සහකාර (දෙපාර්තමේන්තුමය ) | 24 | 12 | 12 |
| 44. ධීවර පරීක්ෂක (දෙපාර්තමේන්තුමය ) | 48 | 48 | - |
| 45. රියදුරු සේවය (ඒකාබද්ධ සේවය ) | 25 | 19 | 06 |
| 46. කාර්යාල සේවක සේවය (ඒකාබද්ධ සේවය ) | 73 | 63 | 10 |
| 47. නිවාරන සැරයන් (දෙපාර්තමේන්තුමය ) | 02 | 01 | 01 |
| 48. නිවාරන නියාමක (දෙපාර්තමේන්තුමය ) | 03 | 03 | - |
| 49. බස් කොන්දොස්තර (දෙපාර්තමේන්තුමය ) | 01 | 01 | - |
| 50. බංගලා භාරකරු (දෙපාර්තමේන්තුමය ) | 03 | 01 | 02 |
| එකතුව | 1006 | 682 | 324 |

පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ ( කළමනාකරණ) හා අධ්‍යක්ෂ ( කර්මාන්ත) යන තනතුරුවල රාජකාරි ඉටුකිරීම සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) හා සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය ) නිලධාරීන් දෙදෙනකු විසින් සිදුකරනු ලබයි. පුරප්පාඩුව පවතින දිස්ත්‍රික් 04 ක සහකාර අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරි ආවරනය කිරීම ධීවර පරීක්ෂක 1 ශ්‍රේණිය නිලධාරීන් 04 දෙනකු විසින් සිදුකරනු ලබයි. තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිළධාරී එක් අයෙකු අතිරික්ත වන අතර භාෂා පරිවර්තක එක් අයෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටියි.

# 2. ධීවර කළමනාකරණ අංශය

## 2.1. අරමුණ

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය තිරසාර ලෙස පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ජල තීරයේ සහ මහ මුහුදේ ධීවර සම්පත් කළමනාකරණය විධිමත් කිරීම, සංරක්ෂණය සහ සංවර්ධනය කිරීමට කටයුතු කිරීම මෙම අංශයේ අරමුණයි.

## 2.2. කාර්යභාරය

එම අරමුණ සපුරා ගැනිම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කිරිම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

- ධීවර නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරිම.
- ධීවර යාත්‍රා ලියාපදිංචිය.
- ධීවර යාත්‍රා උකස් කිරිම.
- ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශ ධීවර යාත්‍රා මගින් මසුන් ප්‍රති අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරිම.
- විසිතුරු මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- මුහුදු කූඩැල්ලන් හා පොකිරිස්සන් ඇල්ලීම, සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය හා අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- හක් බෙල්ලන්, බෙලි කටු හා මෝරවරල් ප්‍රවාහනය හා අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- මාදැල් වරාය හා හිමිකරුවන් ලියාපදිංචි කිරීම හා අවසරපත්‍ර නිකුත් කිරීම.
- ධීවර කාර්මිකයින් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- මුහුදේ අතරමං වූ හා විදේශ රටවල අත්අඩංගුවට පත් ධීවරයින් නිදහස් කර ගැනීම.
- ආපදාවන්ට පත්වන ධීවරයින්ගේ පවුල් වලට වියලි සලාක ලබා දීම.
- ධීවර කලමනාකරණ ප්‍රදේශ, ධීවර කමිටු හා අධිකාරි පිහිටුවීම එකී ආයතන මගින් ධිවර සංවර්ධන කළමනාකරණ සැලසුම් සම්පාදනය කරවීම හා ක්‍රියාත්මක කරවීම.
- තොටුපළ ධීවර සංවිධාන, තොටුපළ කළමනාකරණ කමිටු, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ / පළාත් කමිටු, ජාතික මට්ටමේ කමිටු පිහිටුවීම හා එම සංවිධාන ලවා ධීවර සංවර්ධන සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කරවීම.
- බහුදින ධීවර යාත්‍රා නියමුවන් පුහුණු කරවිම.
- ධීවර කර්මාන්තය හා ප්‍රජාව පිළිබඳ දත්ත තොරතුරු එක්රැස් කිරිම හා විශ්ලේෂණය.
- ධීවර ආරවුල් විසඳිම .
- මහමුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන යාත්‍රාවල හිමිකරුවන්, නියමුවන් හා ගැනියන් සඳහා නීතිරීති හා කලාපීය ගිවිසුම්වලට අදාල සම්මුතීන් පිළිබදව දැනුවත් කිරීම.
- වෙරළබඩ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා හිමිකරුවන් වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් සඳහා වන ක්‍රමෝපායන් හා නීතිරීති පිළිබදව දැනුවත් කිරීම.
- මහමුහුදේ හා වෙරළබඩ ධීවර කර්මාන්තයට අදාල නීතිරීති හා කලාපීය සම්මුතීන් පිළිබදව ධීවර නිළධාරීන් හා අනෙකුත් අදාල පාර්ශ්වකරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම.

## 2.3. 2017 වසරේ කාර්ය සාධනය

### 2.3.1. නීති විරෝධී ධීවර කටයුතු වලට එරෙහි නෛතික ක්‍රියා මාර්ග හා 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක කරනු ලබන නියෝග, පනත් හා නියමයන් වල පියවර

| නීතිමය කටයුතු | ප්‍රගතිය |
|---|---|
| 1.1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන වලට අනනුකූලවීමට එරෙහිව ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග - විනාශකාරී ධීවර ආම්පන්න භාවිතය නවතාලීම සඳහා. | නඩු 427 ක් පවරා ඇත. |
| 2. 2017 අංක 11 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත. | පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත. |
| 3. 1979 ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත (සංශෝධන). | නීතිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. |
| 4. 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය පනත (බලය ලත් නිලධරයන්ගේ බලතල වලට බාධා කිරීම). | නීතිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. |
| 5. 2017 අංක 1 දරන ධීවර මෙහෙයුම්වලදී උල් කරන ලද කූරු භාවිතා කිරීම තහනම් කිරීමේ නියෝග. - අංක 2008/31 සහ 2017.03.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. | අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර නීතිය ක්‍රියාත්මක කරනු ලබයි. |
| 6. 2017 තඹුවා මත්ස්‍ය විශේෂය ඇල්ලීම තහනම් කිරීමේ නියෝග. අංක 2014/4 සහ 2017.04.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. | අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර නීතිය ක්‍රියාත්මක කරනු ලබයි. |
| 7. 2017 මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීමේ නියෝග. අංක 2023/51 සහ 2017.06.15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. | අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර නීතිය ක්‍රියාත්මක කරනු ලබයි. |
| 8. 2015 මාර්තු මස 26 වැනි දින අංක 1907/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළබඳ නියෝග සංශෝධනය. - අංක 2027/31 සහ 2017.07.13. දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. | අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර නීතිය ක්‍රියාත්මක කරනු ලබයි |

| නීතිමය කටයුතු | ප්‍රගතිය |
|---|---|
| 9. 2016 ශ්‍රී ලංකා ජල තීරය තුල මසුන් සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීමේ නියෝග. අංක 2008/30 සහ 2017.03.03. දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. | පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. |
| 10. 2018 ඉලෙක්ට්‍රොනික ලොග් දත්ත පද්ධතිය මගින් ශ්‍රී ලංකා ජල තීරයේ යාත්‍රා නිරීක්ෂණ සහ දත්ත කළමනාකරණ නියෝග. | කෙටුම්පත් කරමින් පවතී |
| 11. නිල් පිහිනුම් කකුළුවන් ධීවර කළමනාකරණ නියෝග.. | කෙටුම්පත් කරමින් පවතී. |
| 12. 2018 කෘත්‍රිම උපස්තර මත වගා කරන කොරල් විශේෂ අපනයනය කිරීමේ නියෝග. | නීති කෙටුම්පත් සම්පාදකතුමියගේ අනුමැතිය සඳහා යවා ඇත |
| 13. නැගෙනහිර වෙරළ (අම්පාර දිස්ත්‍රික්ක) ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් නම් කිරීම. - අංක 2036/27 සහ 2017.09.13. දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය. | ධීවර කළමනාකරණ සහ සහභාගිත්ව කමිටු පිහිටුවීමට නියමිතව ඇත. |
| 14. අංක 1997/20 සහ 2016.12.15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත තලං කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ ධීවර කමිටුව පිහිටුවා ලියාපදිංචි කිරීම. - අංක 2027/33 සහ 2017.07.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය. | ධීවර කළමනාකරණ සහ සහභාගිත්ව කමිටු පිහිටුවීමට නියමිතව ඇත |
| 15. අංක 1997/17 සහ 2016.12.15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මාදම්පා කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ ධීවර කමිටුව පිහිටුවා ලියාපදිංචි කිරීම. - අංක 2027/33 සහ 2017.07.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය | ධීවර කළමනාකරණ සහ සහභාගිත්ව කමිටු පිහිටුවීමට නියමිතව ඇත. |
| 16. අංක 1997/18 සහ 2016.12.15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කොග්ගල කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ ධීවර කමිටුව පිහිටුවා ලියාපදිංචි කිරීම. - අංක 2027/33 සහ 2017.07.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය. | ධීවර කළමනාකරණ සහ සහභාගිත්ව කමිටු පිහිටුවීමට නියමිතව ඇත. |
| 17. අංක 1997/19 සහ 2016.12.15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ගරාඩුව කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ ධීවර කමිටුව පිහිටුවා ලියාපදිංචි කිරීම. - අංක 2027/33 සහ 2017.07.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය. | ධීවර කළමනාකරණ සහ සහභාගිත්ව කමිටු පිහිටුවීමට නියමිතව ඇත |

## 2.3.2 ජාතික හා අන්තර්ජාතික නිති සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු තිරසාර ලෙස කළමනාකරණය, නියාමනය හා සංවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම් | ප්‍රධාන කාර්යසාධක දර්ශකය | ඉලක්කය | ඉලක්ක ලගා කර ගැනීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම (කරදිය) . | පළමු ලියාපදිංචිය සිදුකර ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. | 1,500 | 1,348 | 90% |
| ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම (මිරිදිය) . | පළමු ලියාපදිංචිය සිදුකර ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. | 400 | 246 | 62% |
| ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම (කරදිය). | මහ මුහුදේ ධීවර බලපත්‍ර නිකුත් කිරීම. | 1,500 | 1,427 | 95% |
| මහමුහුදේ ධීවර මෙහෙයුම් කටයුතු නියාමන ක්‍රමයක් පවත්වා ගැනීම. | IMUL යාත්‍රා සඳහා ලොග් පොත් නිකුත් කිරීම. | 5,000 | 4,874 | 97% |
| | ධීවරයින්ගෙන් ලොග් සටහන් රැස් කිරීම. | 20,000 | 44,250 | 221% |
| | යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම. | 1,000 | 686 | 68% |
| ධීවර කාර්මිකයින්ගේ අනන්‍යතාව සහතික කිරීම. | ධීවර කාර්මිකයින් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම. | 2,000 | 1,922 | 96% |
| මාදැල් ධීවර මෙහෙයුම් කටයුතු නියාමනය. | මාදැල් බලපත්‍ර නිකුත් කිරීම. | 985 | 647 | 65% |
| විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා නියාමනය කිරීම. | විසිතුරු මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 70 | 68 | 97% |
| | විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 75 | 65 | 82% |
| | විසිතුරු මසුන් ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 25 | 14 | 56% |
| පොකිරිස්සන් සම්බන්ධ ධීවර ක්‍රියාකාරකම් නියාමනය කිරීම. | පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 120 | 111 | 92% |
| | පොකිරිස්සන් සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම . | 30 | 31 | 103% |

| ක්‍රියාකාරකම් | ප්‍රධාන කාර්යසාධක දර්ශකය | ඉලක්කය | ඉලක්ක ලගා කර ගැනීම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| හක් බෙල්ලන් සම්බන්ධ ධීවර ක්‍රියාකාරකම් නියාමනය කිරීම. | හක් බෙල්ලන් අපනයන සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 20 | 26 | 130% |
| | හක් බෙල්ලන් ප්‍රවාහනය හා සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 35 | 48 | 137% |
| මුහුදු කූඩැල්ලන් සම්බන්ධ ධීවර ක්‍රියාකාරකම් නියාමනය කිරීම. | මුහුදු කූඩැල්ලන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 50 | 53 | 106% |
| | මුහුදු කූඩැල්ලන් ප්‍රවාහනය හා සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 60 | 75 | 125% |
| වෙනත් ධීවර ක්‍රියාකාරකම් නියාමනය කිරීම. | කෘත්‍රිම උපස්තර මත වගාකරන ලද මුහුදු ජීවීන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 15 | 04 | 26% |
| | අජීවී කවච ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 2017 වසර සඳහා නිකුත් කර නොමැත | | |
| | විසිතුරු භාණ්ඩ කර්මාන්තය සඳහා අජීවී බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම. | 50 | 37 | 74% |
| | විදේශීය ධීවර යාත්‍රා මගින් වරාය සේවා හා පහසුකම් ලබා ගැනීම. | 34 | 53 | 155% |

## 2.3.3 යාත්‍රා නියමුවන් පුහුණු කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | සාගර විශ්වවිද්‍යාලය | | සිනෙක් කැම්පස් | | සහභාගිවූවන් මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | |
| ගාල්ල | 05 | 114 | 07 | 443 | 557 |
| මීගමුව | 24 | 592 | - | - | 592 |
| පුත්තලම | - | - | 03 | 134 | 134 |
| තංගල්ල | 31 | 800 | - | - | 800 |
| මාතර | - | - | 07 | 222 | 222 |
| මඩකලපුව | 11 | 271 | - | - | 271 |

| දිස්ත්‍රික්කය | සාගර විශ්වවිද්‍යාලය | | සිනෙක් කැම්පස් | | සහභාගිවූවන් මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව | |
| කළුතර | 10 | 260 | - | - | 260 |
| ත්‍රිකුණාමලය | 04 | 92 | - | - | 92 |
| යාපනය | 02 | 40 | - | - | 40 |
| හලාවත | - | - | 03 | 227 | 227 |
| මුළු සංඛ්‍යාව | 87 | 2169 | 20 | 1026 | 3195 |

## 2.3.4. පුහුණු කිරීම් හා දැනුවත් කිරීම් වැඩසටහන් ප්‍රගතිය

| වැඩසටහන් විස්තරය | දින ගණන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. උසාවි කාර්යපටිපාටිය (උසස්) පාඨමාලාව | 20 | 02 | 54 |
| 2. නාවික නිළධාරීන් පොලිස් නිලධාරීන් හා වෙරළාරක්ෂක නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීම | 07 | 05 | 742 |
| 3. මසුන් පරිහරණය සහ තත්ව පාලනය | 01 | 01 | 40 |
| 4. නායකත්ව පුහුණු වැඩමුළුව | 03 | 01 | 65 |
| 5. ධාරිතා වර්ධනය "කලපුවක් සමඟ ගමක් වැඩසටහන" | 02 | 01 | 60 |
| 6. ඊ ලොග් පොත් පිළිබඳව හා නීති විරෝධී අවිධිමත් හා වාර්තා ගත නොවන ධීවර කටයුතු පිළිබඳ දැනුවත් කිරීම | 01 | 01 | 111 |
| 7. ඊ ලොග් පොත් මෘදුකාංගය භාවිතය පිළිබඳ පුහුණුව | 02 | 01 | 64 |
| 8. ගැඹුරු මුහුදේ හා වෙරළාශ්‍රිත ධීවර කටයුතු පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම. | 04 | 04 | 338 |
| 9. වෙරළාශ්‍රිත ධීවර කටයුතු පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම. | 01 | 01 | 85 |
| මුළු සංඛ්‍යාව | 41 | 17 | 1559 |

# 3. ධීවර කර්මාන්ත අංශය

## 3.1. අරමුණ

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දිම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමි නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධිවර කර්මාන්තය සංවර්ධනය කිරිම, විධිමත් කිරිම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරිම හා ධිවර ප්‍රජාවගේ සමාජීය හා ආර්ථික තත්වය ඉහළ නැංවිමට අවශ්‍ය පියවර ගැනීම ධිවර කර්මාන්ත අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

## 3.2. කාර්ය භාරය

- ධිවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරිම නියාමනය හා අධීක්ෂණය කිරිම
- ධිවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දිම
- ධිවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම නියාමනය සහ අධීක්ෂණය කිරිම
- ධිවර කාර්මිකයින් සහ ධිවර සමිති ලියාපදිංචි කිරිම
- ධිවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරිම
- වෙරළාශ්‍රිත ඉදි කිරිම් ව්‍යාපෘතිවලට අදාලව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා නිර්දේශ ලබාදීම
- ධිවර ක්ෂේත්‍රයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම
- ධිවර සහනාධාර වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම
- ධිවර ණය යෝජනා ක්‍රම
- ධිවර කාර්මික රක්ෂණය හා විශ්‍රම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරිම මගින් ධිවර සමාජ ආරක්ෂණය
- හදිසි ආපදා අවස්ථාවල දි විපතට පත්වූවන් ගලවා ගැනිම කටයුතු සහ සහන සැලසිමේ කටයුතු සම්බන්ධිකරණය

එසේම ධිවර දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය හා විශේෂ ධිවර ගැටළු සම්බන්ධීකරණය ද මෙම අංශය මගින් සිදු කරයි.

## 3.3. 2017 වසරේ කාර්ය සාධනය

### 3.3.1. ධීවරයින් හා ධීවර යාත්‍රාවල සුරක්ෂිතතාවය තහවුරුකිරීම සඳහා ධීවර කර්මාන්තය විධිමත් කිරීම

| කාර්යය | 2017 වර්ෂය තුළ ප්‍රගතිය |
|---|---|
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව | 21706 |
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 69994 |
| ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව | 2427 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම | 14147 |
| ධීවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම | 44 |
| ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 24 |

2014 සිට 2017 දක්වා වූ වර්ෂවල ධීවර යාත්‍රා රක්ෂණය කිරීමේ ප්‍රගතිය සහ ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීමේ ප්‍රගතිය සන්සන්දනාත්මකව පහතින් දක්වා ඇත







රක්ෂණය කරන ලද ධීවර කාර්මිකයින් සංඛ්‍යාව

## 3.3.2. නව ධීවර රක්ෂණය

ධීවර කාර්මිකයින් මුහුණ දෙන අවදානම් තත්වය සැලකිල්ලට ගෙන ධීවර පවුල්වල ආර්ථික සුරක්ෂිතතාවය සහතික කිරිමේ අරමුණින් ධීවරයින් සඳහා විවිධ රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන අතර 2016 වර්ෂයේදි රජය මගින් සියලුම ධීවර කාර්මිකයින් සඳහා හදිසි ආපදා රක්ෂණාවරණයක් හඳුන්වා දෙන ලද අතර මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අය කිරිමක් සිදු නොකරයි.

මේ යටතේ හදිසි ආපදාවක් හේතුවෙන් මිය යන ධීවර කාර්මිකයෙකු සඳහා ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක රක්ෂණාවරණයක් ලබා දෙන අතර මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික රක්ෂණ භාර අරමුදල සම්බන්ධිකරණයෙන් ක්‍රියාත්මක කරනු ලබයි මේ යටතේ ප්‍රතිලාභි පවුල් 24 ක් සඳහා මෙම වසර තුල රක්ෂණ වන්දි ලබා දි ඇත

## 3.3.3. දිවි සයුර ධීවර රක්ෂණය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සෙලින්කෝ රක්ෂණ සමාගම සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන දිවි සයුර හදිසි අනතුරු රක්ෂණය මගින් මුහුදේදි සහ ගොඩබිම දි සිදු වන සියලු ජීවිත අනතුරු (හදිසි අනතුරකදි මරණයට පත් විම සදාකාලික පූර්ණ දුබලතාවයට හෝ අර්ධ ආබාධිත විම හා අතුරුදහන්විම්) ආවරණය කරන අතර සාමාජිකයෙකු වර්ෂයකට ගෙවිය යුතු රක්ෂණ වාරික මුදල (සියලු බදු සහිතව) රු 1036.00 කි
හදිසි අනතුරකදි මරණයට පත් විම හෝ සදාකාලික පූර්ණ දුබලතාවයට පත් විමකදි රු 1000 000/-ක වන්දි මුදලක් ද ස්වාභාවික මරණයකදි රු 200 000/-ක වන්දි මුදලක් ද මෙමගින් ලබා දේ

| | |
|---|---|
| රක්ෂණය සඳහා නව බඳවා ගැනිම් | 39728 |
| අලුත් කිරිම් | 2723 |
| ස්වාභාවික මරණ සඳහා වන්දි ගෙවිම් යටතේ ප්‍රතිලාභ ලැබි ඇති ධීවර පවුල් සංඛ්‍යාව | 21 |
| හදිසි අනතුරු මරණ සඳහා වන්දි ගෙවිම් යටතේ ප්‍රතිලාභ ලැබි ඇති ධීවර පවුල් සංඛ්‍යාව | 07 |

## 3.3.4. දියවර දිරිය ණය යෝජනා ක්‍රමය

නව තාක්ෂණය හඳුන්වා දිම තුලින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරිම ගුණාත්මක තත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනිම සඳහා ධීවර යාත්‍රා වැඩිදියුණු කිරිම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසිම අරමුණු කර ගනිමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුව සමග එක්ව දියවර දිරිය අඩු පොලි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබා දෙන අතර පොලි අනුපාත පහත පරිදි වේ

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 5%
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 7%
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොලි සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමයට ලබා දේ
- ධීවර යාත්‍රාංගන වැඩි දියුණු කිරිම්, අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරිම්(RSW, CSW), මරුවැල් පන්න හා වින්ච් සවි කිරිම් සඳහා ණය ලබා දිමේදි ප්‍රමුඛතාව ලබා දේ
- ප්‍රතිලාභින් 442 ක් සඳහා ණය ලබා දි ඇති අතර ලබා දි ඇති මුලු ණය ප්‍රමාණය රුපියල් මිලියන 1092.36කි

### 3.3.5. 50% සහනාධාර යෝජනා ක්‍රමය යටතේ අඩි 55ට වැඩි ධීවර යාත්‍රා ප්‍රවර්ධනය කිරිම

ගුණාත්මක තත්වයෙන් ඉහල වැඩි මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනිම සඳහා නවින තාක්ෂණික උපාංගවලින් සමන්විත අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය කිරිමේ අවශ්‍යතාවය හදුනා ගනිමින් ඒ සඳහා ධීවර කාර්මිකයින් යොමු කිරිම සඳහා 50% සහනාධාර යෝජනා ක්‍රමයක් 2016 සිට ක්‍රියාත්මක කරන ලදි ඒ යටතේ අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය සඳහා එක් යාත්‍රාවක් සඳහා රුපියල් ලක්ෂ 149.50 බැගින් ධීවර යාත්‍රා 5ක් සඳහා රුපියල් ලක්ෂ 747.50 ක් ලබා දි ඇත.




### 3.3.6. ධීවර යාත්‍රා සඳහා නවින තාක්ෂණය වැඩිදියුණු කිරිමට 50%ක සහනාධාර ලබා දීමේ වැඩසටහන

මේ යටතේ ධීවර යාත්‍රාවලට මරුවැල් පන්න වින්ච් යන්ත්‍ර සිසිලන පද්ධති ලබා දිම/අලුත්වැඩියා කිරිම සඳහා 50%ක සහනාධාරයක් ලබා දෙන ලදි
ඒ අනුව දේශිය ජල තිරයේ ක්‍රියාත්මක වන ධීවර යාත්‍රා 50ක් සඳහා එක් යාත්‍රාවකට උපරිම රුපියල් ලක්ෂ 4 බැගින් වු සහනාධාර මුදලක් ද ජාත්‍යන්තර ජල තිරයේ ක්‍රියාත්මක ධීවර යාත්‍රා සඳහා එක් යාත්‍රාවකට උපරිම රුපියල් ලක්ෂ 12.5 ක සහනාධාරයක් ද ලබා දෙන ලදි. ඒ අනුව මෙම වැඩසටහන සඳහා වැය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 82.5කි

### 3.3.7. විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන්

විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුන්වා දිම යටතේ පසු අස්වනු තාක්ෂණය වැඩිදියුණු කිරිම අරමුණු කර ගනිමින් තෝරා ගත් ධීවර පවුල් සඳහා විශේෂයෙන් ධීවර කාන්තාවන් සඳහා කරවල උම්බලකඩ නිෂ්පාදනය පිලිබඳ තාක්ෂණික දැනුම ලබා දිමත් ව්‍යාපෘති ආරම්භ කිරිම සඳහා මුලික උපකරණ ලබා දිමත් සිදු කරන ලදි. මේ යටතේ මාතර පුත්තලම සහ කලුතර දිස්ත්‍රික්කවල ප්‍රතිලාභින් 146 ක් සඳහා උම්බලකඩ සහ කරවල නිෂ්පාදන වැඩසටහන් මෙම වසර තුල ක්‍රියාත්මක කරන ලදි





### 3.3.8. දියවර පියස නිවාස හා සනිපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන

ධීවර ගම්මානවල විධිමත් නිවාස හා සනිපාරක්ෂක පහසුකම් නොමැති ධීවර ජනතාව සඳහා නිවාස හා සනිපාරක්ෂක පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මේ යටතේ නව නිවසක් ඉදි කිරීම වෙනුවෙන් එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් ලක්ෂ 3ක් ද නිවාස අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් ලක්ෂයක් බැගින් ද ලබා දෙන ලදි එසේම සනිපාරක්ෂක පහසුකම් නොමැති ධීවර පවුල් සඳහා වැසිකිළියක් ඉදි කිරීමට රුපියල් 30 000/- ක් ද අලුත්වැඩියාව සඳහා රු 15 000/-ක් ද මේ යටතේ ලබා දෙන ලදි.

ඒ අනුව පුත්තලම කිරිමුන්දලම, ත්‍රිකුණාමලය සාගරපුර සහ තංගල්ල විහාරමහදේවිපුර ආදර්ශ ධීවර නිවාස ව්‍යාපෘති 3 ක් ආරම්භ කර ඇත.

| ආදර්ශ ගම්මානය | නිවාස සංඛ්‍යාව | වැය කල මුදල රු .මිලි. |
|---|---|---|
| පුත්තලම කිරිමුන්දලම නිවාස ව්‍යාපෘතිය | 50 | 15.0 |
| ත්‍රිකුණාමලය සාගරපුර නිවාස ව්‍යාපෘතිය | 21 | 6.3 |
| තංගල්ල විහාරමහා දේවිපුර නිවාස ව්‍යාපෘතිය | 44 | 13.2 |
| එකතුව | 115 | 34.5 |

මීට අමතරව නිවාස වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රතිලාභීන් 2147ක් සඳහා රුපියල් මිලියන 220.9ක් ද සනිපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රතිලාභීන් 2771ක් සඳහා රුපියල් මිලියන 75.42ක් ද වැය කර ඇත








පුත්තලම
කිරිමුන්දලම
නිවාස
ව්‍යාපෘතිය

### 3.3.9. යටිතල පහසුකම් සංවර්ධනය

සංවර්ධන යෝජනා යටතේ ධිවර දිස්ත්‍රික්ක සියල්ල ආවරණය වන පරිදි ධිවර ප්‍රජාව උදෙසා විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. එමගින් තොටුපල සංවර්ධනය කිරිම් ජැටි ඉදි කිරිම් බිකන් පහන් ලබා දිම ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරිම  මසුන් අලෙවි ස්ථාන වැඩිදියුණු කිරිම  දැල් සැකසුම් මධ්‍යස්ථාන /ප්‍රජා ශාලා ඉදි කිරිම් මොය කට කලපු ගැඹුරු කිරිම් සිදු කරන ලදි

මේ යටතේ තොටුපල සංවර්ධන ව්‍යාපෘති 22ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 49.05ක් වැය කර ඇති අතර  2017 වසර තුල යටිතල පහසුකම් සංවර්ධනයට වැය කර ඇති මුලු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 112.05කි



වන්නිමුන්දලම බහු කාර්ය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය



කල්ලුක්කුලිය අව් ආවරණ ඉදිකිරිම

# 4. ධීවර නිෂ්පාදන තත්ත්ව පාලන අංශය

## 4.1 අරමුණ

යුරෝපා වෙළඳ පොළට අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදන සඳහා යුරෝපීය කොමිසම විසින් පනවන ලද අවශ්‍යතාවයන් සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් මෙම අංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද අතර එය 1999.01.04 දින සිට ක්‍රියාත්මක වේ.

## 4.2 පරමාර්ථ

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය නම් 1998 දී ප්‍රකාශයට පත් කරන ලද මත්ස්‍ය නිෂ්පාදන නියෝග ක්‍රියාත්මක කිරිම යටතේ ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර වෙළඳපලට අපනයනය කරනු ලබන මනුෂ්‍ය පරිභෝජනය සඳහා වූ මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ඉහළ මට්ටමින් තහවුරු කිරිම වේ.

## 4.3 කාර්යයන්

ඉහත අරමුණු ලබා කර ගැනිම පිණිස පහත කාර්යයන් මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරිම
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතනවලට අපනයනය සඳහා මසුන් සකස් කිරිමට බලය ලබාදිම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නිරන්තරව පරික්ෂාවට ලක් කිරිම.
- මසුන් ගොඩබාන ස්ථාන පරික්ෂා කිරිම.
- අපනයනය සඳහා මසුන් සපයනු ලබන ධීවර යාත්‍රා පරික්ෂා කිරිම
- අපනයනය පිණිස යොදා ගන්නා මසුන් ප්‍රවාහනය කරනු ලබන අයුරු පරික්ෂා කිරිම.
- අපනයනය කරනු ලබන සෑම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයක් සඳහාම ස්වස්ථතා (Health Certificate) සහතික නිකුත් කිරිම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍ය ආක්ෂිතභාවය තහවුරු කරන පරික්ෂණ වාර්තා (Test Report) නිකුත් කරනු ලබන පරික්ෂණාගාර අනුමත කිරිම.
- අදාල ස්ථානවලින් ලබාගත් සාම්පල අනුමත පරික්ෂණාගාරවලදි පරික්ෂාවට ලක් කිරිම පිණිස නිල සාම්පල පරික්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරිම.
- මසුන් සැකසීමේ ස්ථාන, බෝට්ටු හා මසුන් ගොඩබාන ස්ථාන රෙගුලාසියේ අඩංගු අදාල කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථා වලදී ඒ සම්බන්ධව නිසි පියවර ගැනීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදාල පියවර ගැනිම.
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය මෙන්ම අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රාවල කාර්යය මණ්ඩල සඳහා මත්ස්‍ය පරිහරණය පිළිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන් සංවිධානය කිරිම හා ක්‍රියාත්මක කිරිම.
- ජලජිවි වගා නිෂ්පාදන (ඉස්සන්) සඳහා භාවිතා වන ප්‍රතිජීවක බෙහෙත් වර්ග හා රසායනික ද්‍රව්‍ය පාලනය කිරිම පිණිස ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරිම.
- මසුන් ඇල්ලීමේ සහතික නිකුත්කිරීම.

## 4.4 2017 වසරේ කාර්යසාධනය

### 4.4.1. මත්ස්‍ය නිෂ්පාදන තත්ත්ව පාලනය හා පසු අස්වනු හානිය අඩු කිරීම.

### 4.4.2. නව මත්ස්‍ය පිරිසැකසුම් ආයතන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අළුත් කිරීම.

**මත්ස්‍ය පිරිසැකසුම් ආයතන ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය - 2017**

| | |
|---|---|
| ලියාපදිංචිය අළුත් කරන ලද මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන සංඛ්‍යාව | **52** |
| ලැයිස්තුවට ඇතුලත් කරන ලද නව මත්ස්‍ය ඇසුරුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | **05** |
| EU පිරිසැකසුම් කර්මාන්ත ශාලා සංඛ්‍යාව | **33** |
| EU නොවන පිරිසැකසුම් කර්මාන්ත ශාලා සංඛ්‍යාව | **07** |
| ඇසුරුම් මධ්‍යස්ථාන ( චීනය වෙනත් රටවල් ) | **17** |

### 4.4.3. ස්වස්ථතා සහතික නිකුත් කිරීම.

මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන රටේ අවශ්‍යතාවලට අනුව ධීවර නිෂ්පාදන අපනයනය සඳහා වන සියලුම මාළු තොග සඳහා තත්ත්ව පාලන අංශය මඟින් ස්වස්ථතා සහතික නිකුත් කරනු ලබන අතර එක් ස්වස්ථතා සහතිකයක් සඳහා රු. 200 ක මුදලක් අය කරනු ලැබේ. ප්‍රධාන අපනයන වෙළඳපලවල්

යුරෝපා ආර්ථික හවුලට අයත් රටවල්
ඇමරිකා එක්සත් ජනපදය
ජපානය
චීනය
රුසියාව
මැදපෙරදිගරටවල්

**ස්වස්ථතා සහතික නිකුත් කිරීමේ ප්‍රගතිය - 2017**

| | |
|---|---|
| නිකුත් කළ ස්වස්ථතා සහතික සංඛ්‍යාව | 33,787 |
| නිකුත් කළ මසුන් ඇල්ලීමේ සහතික සංඛ්‍යාව | 8,994 |
| ස්වස්ථතා සහතික නිකුත් කිරීම මගින් උපයන ලද රාජ්‍ය ආදායමට බැර කරනු ලැබූ මුදල | රුපියල් මිලියන 6.737 |

## 4.4.4. ස්වස්ථතා සහතික යටතේ අපනයනය කරනු ලැබූ මුහුදු ආහාර

**මත්ස්‍ය අපනයනය සහ විනිමය උත්පාදන - 2017**

| | |
|---|---|
| 2017 වසර තුළ අපනයනය කරනු ලැබූ මුහුදු ආහාර ප්‍රමාණය | මෙට්‍රික් ටොන් 13,000 |
| මත්ස්‍ය අපනයනය මඟින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය | රුපියල් මිලියන 39,230 |

## 4.4.5. නිල නියැදි (සාම්පල්) වැඩසටහන

**2017/01/01 දින සිට 2017/12/31 දක්වා ලබාගත් සම්පල් පිළිබඳ විස්තර**

| සාම්පල ලබාගත් ස්ථානය | සාම්පල වර්ගය | සාම්පල සංඛ්‍යාව |
|---|---|---|
| මත්ස්‍ය පිරිසැකසුම් කර්මාන්තශාලා | **ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ** | |
| | ජලය | 20 |
| | අයිස් | 20 |
| | ඉස්සන්/මසුන්/ | 105 |
| | **රසායනික විශ්ලේෂණ** | |
| | හිස්ටැමින් | 125 |
| | බැර ලෝහ | 19 |
| ඉස්සන් ගොවිපල | **රසායනික විශ්ලේෂණ** | |
| | පලිබෝධනාශක | 7 |
| | බැර ලෝහ | 7 |
| | ප්‍රතිජීවක | 39 |
| | මයිකොටොක්සීන් | 06 |

# 5. අධීක්ෂණය, පාලනය හා සෝදිසි මෙහෙයුම් අංශය

## 5.1. අරමුණ

ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය හා ඉන් පිටතධීවර මෙහෙයුම් කටයුතුවල නිරත ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීම හා එන්ජින් අක්‍රියවීම,මුහුදේදී හදිසි අනතුරට ලක්වීම හා හදිසි අසනීප තත්ත්වයන්ට පත්වීම වැනි ව්‍යසනයන්හීදී අනතුරට පත් ධීවර කාර්මිකයින් හා ධීවර යාත්‍රා බේරා ගැනීම, විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා නැවත මෙරටට ගෙන්වා ගැනීම. අනවසර විදේශීය ධීවර යාත්‍රා පිළිබඳව අදාල ආයතන දැනුවත් කිරිම, ජීවිත හානි වළක්වා ගැනීම හා වෙනත් යම් හදිසි ප්‍රති පියවර ගැනීම සහ ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට පහසුකම් සැළසීම මගින් ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

## 5.2. වගකීම හා කාර්යය භාරය

1. **ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම හා එම කටයුතු කිරීම.**
2. **ධීවර යාත්‍රාවල සන්නිවේදනකටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමටකටයුතු කිරීම.**
3. **ධීවර යාත්‍රාවන්ට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට කටයුතු කර දීම.**
4. **විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා නැවත මෙරටට ගෙන්වා ගැනීම.**
5. **දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.**
6. **දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණ තොරතුරු දෛනිකව ලබා දිම.**

## 5.3 2017 වසරේ කාර්යසාධනය

### 5.3.1. ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම හා එම කටයුතු කිරීම.

ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීමේ කටයුතු ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා ලැබෙන පණිවිඩ මගින් කොළඹ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම් සිදුකළ අතර ගොඩබිම හා මුහුදු ධීවර යාත්‍රා අතර සම්බන්ධතාවක් පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම දිනපතා මෙමගින් යාත්‍රා සඳහා දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණ තොරතුරු දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන්ගේ පණිවිඩ ලබාදීම හා යාත්‍රාවලින් ලබාදෙන්නාවූ හදිසි පණිවිඩ ලබාගැනීම සිදුකෙරේ. මෙම කාර්යයන් සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් සම්බන්ධීකරණය සිදුකෙරෙන අතර මේ සඳහා ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන, කල්පිටිය, හලාවත, තොඩුවාව, කොස්වාඩිය, වෙන්නප්පුව, මීගමුව, කොළඹ, බේරුවල, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාල්ල, වැලිගම, දෙවිනුවර, නිල්වැල්ල, කුඩාවැල්ල, තංගල්ල, කළමැටිය, හම්බන්තොට, කිරින්ද, කල්මුනේ හා ත්‍රිකුණාමලය යන ස්ථාන වල පිහිටුවා ඇත.

යාපනය, වාලච්චේන හා දික්ඕවිට යන ධීවර වරායවලද මෙම ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජනා ඉදිරිපත්වී ඇත.

### 5.3.2. ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.

අන්තර් ජාතික නීති රීතිවලට අනුකූලවීම සඳහා මහ මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවර යාත්‍රා සඳහා ඇමතුම් සංඥා ලබාදීමට විදුලි සංදේශ කොමිෂන් සභාව හා ආරක්ෂක අමාත්‍යාංශය හා එක්ව කටයුතු කර ධීවර යාත්‍රා සඳහා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කරන ලදි. අන්තර් ජාතික නීතිරීති වලට අනුව ධීවර යාත්‍රාවලට ගුවන් විදුලි පණිවිඩ හුවමාරු කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම සඳහා බලපත් ලබාදීමට ධීවර යාත්‍රා හිමියන්ගේ අයදුම්පත් ලබාගෙන විදුලි සංදේශ කොමිෂන් සභාවට ලබාදී විදුලි සංදේශ කොමිෂන් සභාව හා එක්ව කටයුතු කර ධීවර යාත්‍රාවල ගුවන් විදුලි පණිවිඩ හුවමාරු කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම සඳහා බලපත් ලබාදීමට ද කටයුතු කරන ලදි.

| | |
|---|---|
| ගුවන් විදුලි පණිවිඩ හුවමාරු කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම සඳහා බලපත් ලබාදුන් ධීවර යාත්‍රා සංඛ්‍යාව | 1050 |
| ගුවන් විදුලි පණිවිඩ හුවමාරු කිරීමේ යන්ත්‍ර සඳහා ඇමතුම් සංඥා ලබාදුන් ධීවර යාත්‍රා සංඛ්‍යාව | 752 |

### 5.3.3. ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර දීම.

ධීවර යාත්‍රාවලට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදීද, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඔවුන් විසින් රක්ෂණ වන්දි ලබාගැනීමේදීද රක්ෂණ සංස්ථාවන්ට හා යාත්‍රා හිමිකරුවන් හට ලබාදෙන සියලු තොරතුරු ඉදිරිපත් කිරීම. මෙම තොරතුරු ලබා දීම වර්ෂයකට යාත්‍රා 50 - 100 අතර ප්‍රමාණයක ලබාදීම සිදුකරනු ඇත. මෙම තොරතුරු අදාල ප්‍රාදේශීය කාර්යාලවලින් හා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා සටහන් ද අනුව සකස් කරනු ඇත.

| | |
|---|---|
| 2017 වර්ෂයේ දී මහ මුහුදේදී වාර්තා වූ හදිසි අනතුරු සංඛ්‍යාව | 93 |
| හදිසි අනතුරු නිසා තුවාල ලැබූ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 11 |
| හදිසි අනතුරු නිසා මරණයට පත්වූ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 07 |
| හදිසි අනතුරු නිසා විනාශයට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව | 10 |

**5.3.4. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.**

| රට | අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඉන්දියාව | 59 | 12 | 59 | 09 |

මෙම නිදහස් කර ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හා ඉන්දියාවේ පිහිටි ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලයේ නිළධාරීන්ගේ සහයද ලබා ගන්නා ලදි.

**5.3.5. දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.**

| මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|
| 315 | 64 |

ඉන්දියාව, මලයාසියාව, ඉන්දුනීසියාව, මාලදිවයින, අන්දමන්/නිකොබාර් දූපත්, ඕස්ට්‍රේලියාව හා දියාගෝ ගාර්ෂියා යන රටවලට අයත් මෙම ධීවර යාත්‍රා විශාල ප්‍රමාණයක් එන්ජින් අක්‍රියවීම නිසා මුහුදේ පාවෙමින් තිබූ අතර ශ්‍රීලංකා නාවික හමුදාවේ යාත්‍රා, වෙළඳ නැව් හා ධීවර යාත්‍රා මගින්ම යාත්‍රා බේරා ගැනීම් කටයුතු කරන ලදි. එමෙන්ම මුහුදේදී හදිසි අනතුරට ලක්වීම හා හදිසි අසනීප තත්ත්වයන්ට පත්වූ අය ශ්‍රීලංකා නාවික හමුදාවේ ආධාරයෙන් ගොඩබිමට ඉක්මනින් ගෙන්වා වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල් වෙත යවන ලදි.

**5.3.6. ධීවර ප්‍රජාව දැනුවත් කිරිම.**

ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දායකත්වය ලබා දී ඇත. ධීවර කර්මිකයින්ගේ ජීවිත ආරක්ෂාව සඳහා වන උපදෙස් හා හදිසි අනතුරකදි අනුගමනය කල යුතු ආකරය මෙන්ම ගොඩබිම හා සම්බන්ධ වී හදිසි උපකාර ලබා ගන්නා ආකාරයද හා හදිසි කාලගුණ විපර්‍යාසයට අනුව ඇතිවන සුළි කුණාටු වලදි ජීවිත ආරක්ෂා කිරිමට අනුගමනය කරන පිළිවෙත් හා ගුවන් විදුලි බලපත් ලබා ගන්නා ආකාරයන් පිලිබදව දැනුවත් කිරිම් සිදුකරන ලදි.

**5.3.7. පළමු යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරිම.**

යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියේ පළමු නියමු ව්‍යාපෘතිය යාත්‍රා 50 ක් සඳහා ක්‍රියාත්මකකළ අතර, එම සියලු කටයුතු නිරීක්ෂණය කිරීම්, වාර්තා ලබාගැනීම් හා එම වාර්තා අදාල ස්ථාන වලට යොමු කිරීම් සිදුකරන ලදි. මෙම වාර්තා යුරෝපා සංගමය විසින් මසුන් අපනයනය තහනම නිරාකරණය කර ගැනීම සඳහා ගත් පළමු යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය වේ. මෙසඳහා කිසිදු නිළධාරියෙකු පිටස්තරව බඳවා නොගත් අතර මෙම ඒකකයේ සිටින ගුවන්විදුලි නිළධාරීන්ගෙන් එම කටයුතු ද සාර්ථකව සිදුකර ගන්නා ලදි.
පසුව අක්‍රිය තත්වයේ පැවැති අතර නැවතත් සක්‍රීය කර එම පද්ධතිය යාත්‍රා සුපරීක්ෂණ ඒකකය වෙත බාරදිම කරන ලදි.

# 6. අන්තර් ජාතික ධීවර කටයුතු අංශය

## 6.1. දැක්ම

මහ මුහුදේ ධිවර ක්‍රියාකාරකම් අධීක්ෂණය, පාලනය සහ කලමණාකරණ කිරිම් මගින් වගකීමක් සහිත ධීවර සංස්කෘතියක් ස්ථාපිත කරමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය ශක්තිමත් කිරිම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබා දීම.

## 6.2. මෙහෙවර

මහ මුහුදේ ධිවර කටයුතු සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමෙන් සහ අධීක්ෂණය හා පාලනය සඳහා විද්‍යාත්මක හා ජාලගත සම්බන්ධීකරණ ක්‍රම උපායන් යොදා ගනිමින් ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් වලට අනුගතව යමින් නිත්‍යානුකුල වු මහ මුහුදේ ධිවර ක්‍රියාකාරකම් තුලින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබා දීම.

## 6.3. අරමුණු

1) මහ මුහුදේ ධිවර මෙහෙයුම් සිදු කරන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ධීවර යාත්‍රා මගින් අල්ලා ගත් මසුන් නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර ක්‍රියාකාරකම් වලින් තොරව, නීත්‍යානුකූල, නිවැරදි වාර්තා සහිතව සහ විධිමත් ලෙස අල්ලා ගෙන ඇති බවට ජාත්‍යන්තර වශයෙන් තහවුරු කිරීමට අදාල සත්‍යාපන වාර්තා නිකුත් කිරිම.
2) මහ මුහුදේ ධිවර මෙහෙයුම් වලට අදාල සියළු ධීවර වරායන්(20), කාර්යාල, යාත්‍රා අධීක්ෂණ මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂක බලකාය යන මුලික කොටස්කරුවන් සහ නිලධාරින් ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකය කේන්ද්‍ර කොට ගනිමින් ජාලගත සම්බන්ධතාවය මගින් සජීවි ව සම්බන්ධ කිරිම.
3) කලාපීය සහ දේශීය වශයෙන් ලබාදීමට බැදීසිටින ධීවර දත්ත නිසි කලට සහ නිවැරදිව ලබා දීම උදෙසා මහ මුහුදේ (High Sea) ධීවර කටයුතු වලට අයත් හා EEZ සීමාවේ ධීවර කටයුතු වලට අයත් Log Sheets වල සඳහන් තොරතුරු Main web based data base වෙතට ඇතුලත් කිරීම.
4) මහ මුහුදේ ධීවර මෙහෙයුම් වලට අදාල යාත්‍රා දේශ සීමා උල්ලංගනය / VMS අක්‍රිය කිරිම සම්බන්ධයෙන් <u>**තොරතුරු විමර්ශණ කිරිම හා නීති මගින් කටයුතු කිරීම**</u> සහ බහුල වශයෙන් මහ මුහුදේ ධීවර නීති කඩ කරන ලද යාත්‍රා (Risk Vessel) හඳුනාගෙන වාර්තා කිරිම සඳහා පරිසනක ආශ්‍රිතව ස්වයංක්‍රීයව ලකුණු ලබා දීමේ වැඩසටහනක් හඳුන්වා දී එම ලකුණු මත පදනම්ව Risk High Risk යාත්‍රා තොරතුරු අදාල අංශ වෙත ලබා දීම.

## 6.4. කාර්යයන්

6.4.1. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු ගෙන්වාගැනීම හා කළමනාකරණය

6.4.2. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු සත්‍යාපනය කිරිම

6.4.3. ලොග් වාර්තා දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය

6.4.4. තොරතුරු විමර්ශණ කිරිම හා නිති මගින් කටයුතු කිරිම.

## 6.4.1. මහමුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රාවල තොරතුරු ගෙන්වාගැනීම හා කළමනාකරණය

1. යාත්‍රා නිරීක්ෂණ ඒකකයෙන් ඒ ඒ දිනයන්ට අදාල Harbour Arrivals, Departures Boarder Crossing තොරතුරු ගෙන්වා ගැනීම. ( Email හා පිටපත් ලෙස)
2. දිනයට අදාල Arrivals, අදාල දිස්ත්‍රික්ක වලට යැවීමට ලිපිය සකස් කිරිම හා අදාල යාත්‍රා IUU ක්‍රියාකාරකම් සඳහා ලක්වී ඇත්දැයි බැලීම.
3. Arrivals, වලට අදාල ලිපිය සහකාර අධ්‍යක්ෂගේ අවධානයට යොමු කිරිම හා එම ලිපිය අදාල වරායන් වල High Sea Unit වලට හා සහකාර අධ්‍යක්ෂ කාර්යාල වලට Fax හා Email කිරිම.
4. දිනයට අදාල Harbour Arrivals දිස්ත්‍රික්ක වල Harbours වලට දුරකථනය මඟින් දැනුම් දී Log Sheets ගෙන්වා ගැනීම (Fax හෝ Email මගින්).
5. එම Log Sheets ලැබුනු පසු ඒවා ලේඛනයක සටහන් කිරිමෙන් පසු Verification ඒකකය වෙතට යැවීම.
6. VMS ඒකකයෙන් ලැබෙන Boarder Crossing තොරතුරු සහකාර අධ්‍යක්ෂගේ අවධානයට යොමු කිරිම.
7. High Sea යාත්‍රා පිළිබදව යාවත්කාලින වන දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම හා වරායන් වලට Email මගින් සැම දිනකම දැනුම් දීම.
8. දැනුම් දුන් ආපදා වලට ලක්වූ යාත්‍රා පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යෑම.
9. ඒකකය වෙත ලැබෙන Fax පනිවිඩ පිළිබඳ වාර්තාවක් නඩත්තු කිරිම.
10. බහුදින දින ධිවර යාත්‍රා වලට අදාල තොරතුරු දෙපාර්තමේන්තු Web site එකෙහි යාවත්කාලින කිරිම
11. කාලගුණ වාර්තාව ගෙන්වා ගැනීම හා වරායන් වලට email මගින් දැනුම් දීම
12. මසුන් ගැවසෙන ප්‍රදේශ පිලිබදව Nara එකෙන් වාර්තාවක් ගෙන්වා ගැනීම හා වරායන් මගින් ධීවරයන් දැනුවත් කිරීම
13. Possible IUU Vessel List එකක් නඩත්තු කිරීම හා එම වාර්තාව දිනපතා අපනයනකරුවන්ට email මගින් යැවීම
14. දිනපතා පැය 48 කට වඩා VMS Off හා Border crossing යාත්‍රා හදුනා ගෙන අදාල හිමිකරුවන් දැනුවත් කිරීම(ලිපි මගින් ) හා කරුණු විමසීම.
15. EEZ යාත්‍රා සඳහා බලපත්‍ර අංකයක් නිකුත් කිරීම.
16. ප්‍රමාද ලොග් සටහන් පත්‍ර පිළිබද දෛනික වාර්තාවක් අපනයන කරුවන්ට හා අදාල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල වෙත E mail හරහා යොමුකිරිම.
17. ලොග් සටහන් පත්‍ර එවීමට අපොහොසත් ධිවර මෙහෙයුම් පිළිබද ඊට අදාල හේතුව සටහන් කරන ලද තොරතුරු ගොනුවක් පවත්වා ගෙන යාම.
18. IUU මෙහෙයුම් සිදු කළ යාත්‍රා හදුනා ගෙන Risk Vessel List එකක් නඩත්තු කිරීම හා ඒ පිලිබදව අදාල නිලධාරින්, වරායන්, VMS ඒකකය, කළමනාකරණ අංශය දැනුවත් කිරීම. (E MAIL මගින් )

## 6.4.2. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු සත්‍යාපනය කිරිම

1. තොරතුරු උප ඒකකයෙන් Log Sheet Verification ඒකකයට ලැබීම.
2. Log Sheet Verification ඒකකයේ ලේඛනගත කිරිම.
3. ධීවර මෙහෙයුම් වල VMS සිතියම් හා ඒවාට අදාල තොරතුරු, VMS අංශයෙන් Email මගින් Verification ඒකකය වෙත ලැබීම.
4. එම VMS තොරතුරු අභ්‍යන්තර තොරතුරු ජාලය ( Net Work) දත්ත ගොනුවට භාගත කර ගනිමින් ලේඛණ ගත කිරිම.
5. එම Log Sheet හා ඒවාට අදාල ධීවර මෙහෙයුම් වල සිතියම් හා තොරතුරු එකට සංසන්ධනය කර Verification report සකස් කිරිම.
6. එසේ සකස් කල Verification report High Sea Unit Assistant Director ගේ අත්සනින් මෙම දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශය වෙත යොමු කිරිම.
7. එසේ Log Sheet සහ VMS සිතියම් වල අදාල තොරතුරු නොසැසදෙන අවස්ථාවලදී හෝ ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු වලට අදාල නිතිරිති පිළිපැද නොමැති හෝ උල්ලංඝනය කර ඇති අවස්ථාවලදී Verification report නිකුත් කරනු නොලැබෙන අතර ඒ බව දන්වා යාත්‍රා හිමිකරු සහ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයාට පිටපතක් යුතුව ලිපියක් යොමු කරනු ලැබේ.
8. ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු වලට අදාල නිතිරිති උල්ලංඝනය කර ඇති ධීවර මෙහෙයුම් ( වෙනත් රටවල අනන්‍ය ආර්ථික කළාප වලට අනවසරයෙන් ඇතුල් වී ධීවර කටයුතු සිදුකිරිම, නොදන්වා VMS විසන්ධි කර දිනකට වඩා මහා මුහුදේ ධීවර කටයුතු සිදුකර තිබීම) සම්බන්ධව නීතීමය පියවර ගැනීම සඳහා විමර්ශණ අංශයට සහකාර අධ්‍යක්ෂ මගින් යොමු කිරිම.

## 6.4.3. ලොග් වාර්තා දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය

1. මහ මුහුදේ (High Sea) ධීවර කටයුතු වලට අයත් Log Sheets Fax මගින් හා EEZ සීමාවේ ධීවර කටයුතු වලට අයත් Log Sheets තැපැල් මගින් Verification ඒකකය වෙත ලැබේ.
2. ඒකකයට ලැබෙන Log Sheets ගණන ලේඛන ගත කිරිම.
3. High Sea ලොග් පත්‍රිකා ද EEZ ලොග් පත්‍රිකා සමඟ ලැබේ. එම ලොග් පිටු වලින් EEZ හා High sea ලොග් පිටු වෙන් කරගෙන, ඒවා වෙන් වෙන් වශයෙන් ප්‍රධාන දත්ත ගබඩාවට (main web based data base) ඇතුල් කිරිමට දත්ත ඇතුලු කිරිමේ නිලධාරින්ට බෙදා දීම.
4. Log Book හී පලමු පිටුවේ මුලික තොරතුරු එනම් බෝට්ටු ලියාපදිංචි අංකය, යාත්‍රාවේ නම, හිමිකරුගේ නම, ලිපිනය, ජාතික හැදුනුම්පත් අංකය, ධිවර ආම්පන්න පිළිබඳ විස්තර ඇතුලත් කිරිම.
5. Log Sheets වල සඳහන් තොරතුරු එනම් පන්න කල දිනය, පන්න කල ස්ථානයේ අක්ෂාංශ හා දේශාංශ, යොදා ගත් දැලේ විස්තර, පාවිච්චි කරන ලද ඇම වර්ගය, මසුන් ප්‍රමාණය සහ බර main web based data base වෙතට ඇතුලත් කරනු ලැබේ.
6. Log පත්‍රිකා main web based වෙතට ඇතුලත් තිරිමෙන් පසු EEZ Sheets දිස්ත්‍රික්කයට අදාලව file කරනු ලබන අතර High Sea Sheets බෝට්ටු අංකයට අදාලව file කරනු ලැබේ.

7. Main web based එකට ඇතුල් කල නොහැකි අසම්පූර්ණ Log Sheets තෝරා ගෙන එවා දිස්ත්‍රික්කයට අදාලව file කරනු ලැබේ.

8. සියළුම දිස්ත්‍රික් ධීවර කාර්යාල වලින් ලොග් පිටු හා මුල් පිටු සමග ලැබෙන ආවරණ ලිපි හා ප්‍රගති වාර්තා file කිරීමට ලිපි ගොනු පවත්වාගෙන යනු ලබන අතර එම ලිපි ගොනු සතිපතා යාවත්කාලීන කිරීම.

9. ගාල්ල , මාතර, කළුතර , තංගල්ල, මඩකලපුව හා කල්මුණේ දිස්ත්‍රික් ධීවර කාර්යාල වල වරාය වලින් ලැබෙන ලොග් පිටු හා මුල් පිටු වල තොරතුරු Main web based System එකට එම දිස්ත්‍රික් කාර්යාල වලදීම ඇතුලත් කිරීමට එම කාර්යාලවල පුහුණු කල නිලධාරියෙකු පත් කර ඇති අතර ඔහු /ඇය විසින් Main web based System එකට ඇතුල් කල ප්‍රගති වාර්තා සති පතා ගෙන්වාගෙන සකසන සාරාංශ වාර්තාව අදාල අංශ හා අදාල නිලධාරින් වෙත email කිරීම.

10. ගාල්ල , මාතර, කළුතර , තංගල්ල, මඩකලපුව හා කල්මුණේ දිස්ත්‍රික් ධීවර කාර්යාල වල වරාය වලින් ලැබෙන ලොග් පිටු හා මුල් පිටු වල තොරතුරු හා දත්ත ඇතුලත් කිරීමේදී ඇතිවන ගැටළු පිලිබඳව දුරකථනය මගින් සම්බන්ධීකරණය කිරීම .

11. දිස්ත්‍රික් ධීවර කාර්යාල වල ප්‍රගතිය හා high sea log unit අංශයේ ප්‍රගතිය පිලිබඳ සාරාංශ වාර්තාවක් සතිපතා අදාල අංශ වෙත ඉදිරිපත් කිරීම.

### 6.4.4. තොරතුරු විමර්ශණ කිරිම හා නිති මගින් කටයුතු කිරිම

1. යාත්‍රා දේශසීමා උල්ලංගනය / VMS අක්‍රිය කිරිම සම්බන්ධයෙන් PMC මගින් සහකාර අධ්‍යක්ෂ (HSFU) වෙත තොරතුරු ලබා දීම.

2. බලපත්‍ර රහිතව / Departure cancel කර තිබියදී ධීවර රැකියාව සඳහා පිටත්වීම සම්බන්ධව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ මගින් සහකාර අධ්‍යක්ෂ (HSFU) වෙත තොරතුරු ලබා දීම.

3. සහකාර අධ්‍යක්ෂ (HSFU) මගින් ඉහත (i) හා (ii) තොරතුරු විමර්ෂණ අංශයට ලබා දීම.

4. ඉහත (i) සම්බන්ධව දැනුවත් කිරිමේ ලිපි යාත්‍රා හිමිකරු/ අදාල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වෙත යොමු කිරිම/යාත්‍රාවේ ගමන්වාර අත්හිටුවීම.

5. ඉහත (ii) සම්බන්ධව වැටලීම් සිදුකිරිම සඳහා විශේෂ වැටලීම් ඒකකය / විමර්ශන අංශය වෙත තොරතුරු හා බලය ලබා ගැනීම.

6. ඉහත (4) සම්බන්ධව යැවෙන ලිපිවලට ප්‍රතිචාර ලෙස ලැබෙන ප්‍රකාශ සම්බන්ධව ඉදිරි පියවරයන් ගැනීම ( උදා - (i)සමථ කරණය සඳහා හිමිකරු හා නියමුවා ප්‍රධාන කාර්යාලයට කැඳවීම (ii) නඩු පැවරිම සඳහා දිස්ත්‍රික් ධීවර කාර්යාල වෙත උපදෙස් ලබා දීම.

7. ලොග් සටහන් පත්‍රිකා සත්‍යාපනය කිරීමේ දී හඳුනා ගන්නා වැරදි සම්බන්ධව සහකාර අධ්‍යක්ෂ (HSFU) වෙතින් ලැබෙන තොරතුරු අනුව ලොග් නඩු පැවරීම හා සමථකරණ දඩ අයකිරීමට යොමු කිරීම.

8. සමථ කරණය සඳහා යොමු කිරිම් නිති නිලධාරි මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම/ දිස්ත්‍රික් කාර්යාල මගින් නඩු පැවරිම.

9. අධ්‍යක්ෂ ජනරාල් උපදෙස් පරිදි ගමන් වාර අත්හිටුවිම, මෙහෙයුම් බලපත්‍ර අත්හිටුවිම, අවවාද කිරිම් ආදී ක්‍රියා මාර්ග ගැනීම.

10. අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් විමර්ශන කටයුතු.

## 6.5. 2017- ප්‍රගතිය

### 6.5.1. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු ගෙන්වා ගැනීම හා කළමනාකරණය

| | | |
|---|---|---|
| 1. | අවසන් වූ මහ මුහුදේ ධීවර මෙහෙයුම් ගණන | 10,560 |
| 2. | මහ මුහුදේ මෙහෙයුම් වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන | 12,784 |

### 6.5.2. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු සත්‍යාපනය කිරිම

| | | |
|---|---|---|
| 1. | මෙහෙයුම් වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 9,682 |
| 2. | සත්‍යාපන වාර්තා ලබා නොදුන් යාත්‍රා හිමිකරුවන් සඳහා දැනුවත් කිරීම් ගණන | 258 |

### 6.5.3. ලොග් වාර්තා දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය

| | | |
|---|---|---|
| 1. | ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන | 36,901 |
| 2. | වැරදි සහගත ලෙස පිරවූ සහ අසම්පූර්ණ ලොග් පිටපත් ගණන | 1,913 |
| 3. | වැරදි සහගත ලෙස පිරවූ සහ අසම්පූර්ණ ලොග් පත්‍ර පිරවීම සම්බන්ධව යාත්‍රා හිමියන් දැනුවත් කිරීම් ගණන | 79 |

### 6.5.4. තොරතුරු විමර්ශණ කිරිම හා නිති මගින් කටයුතු කිරිම

| | | |
|---|---|---|
| 1. | යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් වාර්තාවූ වෙනත් රටවල මුහුදු සීමා උල්ලංගණය කිරීම් | 54 |
| 2. | යාත්‍රා නිරීක්ෂණඋපකරණ ක්‍රියා විරහිත වීම් | 385 |
| 3. | IUU කටයුතුවලට අදාල ප්‍රකාශ ලබා ගැනීම් | 79 |
| 4. | නියමු බල පත්‍ර අහෝසි කිරීම් | 37 |
| 5. | යාත්‍රා පිටත්වීම අවලංගු කිරිම(Departure cancel) | 452 |
| 6. | යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර අහෝසි කිරීම් | - |
| 7. | නඩු දැමීම සඳහා උපදෙස් ලබාදීම් | 09 |
| 8. | පරිපාලන දඩ අයකිරීම් | 87 |
| 9. | අවවාද කිරිම් | 514 |

# 7. යාත්‍රා නිරීක්ෂණ අංශය

## 7.1. මෙහෙවර

චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගනිමින් ක්‍රියාත්මක වන යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය තුළින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තයේ නියැලෙන 1500 ක පමණ වූ බහුදින ධීවර යාත්‍රා දේශීය නෛතික යාන්ත්‍රනය මගින් බලගැන්වූ ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධිවර කර්මාන්තයේ නියැලෙන ආකාරය එසැනින් නිරීක්ෂණය කිරීම සහ වාර්තාකරණය මගින් ධීවර කර්මාන්තය තිරසර ලෙස සංවර්ධනය කිරීම.

## 7.2. උපාය මාර්ග

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ යාත්‍රා නිරීක්ෂණ අංශය මගින් ජාත්‍යන්තර නාවික චන්ද්‍රිකා තාක්ෂණය (INMARSAT C) යොදාගනිමින් ක්‍රියාත්මක වන යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය තුළින්, සක්‍රීය ධීවර යාත්‍රා මුහුදේ ස්ථානගතව ඇති ආකාරය පිළිබඳව නිරීක්ෂණයට ලක්කිරීම.

## 7.3. 2017 වර්ෂයට අදාලව සිදු කරනු ලැබූ කාර්යයන්

- මහ මුහුදේ ධීවර කර්මාන්තයෙන් ඉවත්වූ බහුදින ධීවර යාත්‍රාවල සවිකර තිබූ යාත්‍රා නිරීක්ෂණ උපකරණ අලුතින් මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක්වූ ධීවර යාත්‍රා සඳහා යාත්‍රා වලට සවිකිරීම.
- යාත්‍රා නිරීක්ෂණ අංශයේ හා ඊට සම්බන්ධිත අනෙකුත් අංශවල නිලධාරීන් පුහුණු කිරීම.
- පවතින ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සඳහා නව උපාය මාර්ග සොයා ගැනීම.
- යාත්‍රා නිරීක්ෂණ ඒකකය වැඩිදියුණු කිරීම හා පවත්වා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජකයා මගින් තාක්ෂණික විශේෂඥතාවය ලබාගැනීම.
- යාවත්කාල කල සියලු යාත්‍රාවන්ගේ පිහිටීම් අන්තර් ජාතික ඒකකය වෙත ලබා දීම.
- යාත්‍රා නිරීක්ෂණ උපකරණය ක්‍රියා විරහිත කරනලද යාත්‍රා සම්බන්ධ තොරතුරු අන්තර්ජාතික ඒකකය වෙත ලබාදීම.
- වෙනත් රටවල අනන්‍ය ආර්ථික මුහුදු සීමාවන්ට ඇතුළු වූ යාත්‍රා සම්බන්ධ තොරතුරු අන්තර්ජාතික ඒකකය වෙත ලබාදීම.
- ආපදාවට ලක් වූ යාත්‍රා හඳුනා ගැනීම සහ ඒ සම්බන්ධ තොරතුරු කඩිනමින් සෝදිසි මෙහෙයුම් අංශය වෙත ලබාදීම සහ ඒ සම්බන්ධව අඛණ්ඩව පසුවිපරම් කිරීම.
- පෙ.ව.7.00, ප.ව.2.00 සහ ප.ව.10.00 ට පහත සඳහන් තොරතුරු යටතේ වාර්තා ලබාගැනීම.
  - ධීවර යාත්‍රා වරායට පැමිණීම පිළිබඳ වාර්තා සහ එක් එක් බෝට්ටුවේ සිතියම් ලබාගැනීම.
  - කිලෝ මීටර් 48 ක් ඇතුලත වරාය සීමාවට ළඟාවන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම.

- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම සහ අවශ්‍ය නෛතික ක්‍රියා මාර්ග ගැනීම සඳහා අන්තර්ජාතික ඒකකය වෙත තොරතුරු වාර්තා කිරීම.
- වරායෙන් පිටත් වෙන ලද ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම.
- යාත්‍රාවල බැටරි විසන්ධි කිරීම් පිළිබඳ වාර්තා ලබාගැනීම සහ අවශ්‍ය නෛතික ක්‍රියා මාර්ග ගැනීම සඳහා අන්තර්ජාතික ඒකකය වෙත තොරතුරු වාර්තා කිරීම.
- යාත්‍රාවල බැටරිය විසන්ධි වී දින දෙකකට පසු එහි ඇතුලත ඇති බැටරියේ ද විසන්ධිවීම් පිළිබඳ වාර්තා ලබාගැනීම.
- යාත්‍රාවල නැවත බැටරිය යථා තත්වයට පැමිණීම පිළිබඳ වාර්තා ලබාගැනීම.
- කාල පරාසයක් තුල ක්‍රියා විරහිතව ඇති යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම.

## 7.4. 2017 - ප්‍රගතිය

### 7.4.1. යාත්‍රා සුපරීක්ෂණය බලගැන්වීමේ කටයුතු

- යාත්‍රා හිමිකරුවන්ට තම යාත්‍රා අපදාවන්ට ලක්වූ අවස්ථාවන්හී දී හා වෙනත් අවස්ථාවන්හි දී අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා පහත සඳහන් ධීවර වරායන් 10 තුළ VPN (VIRTUAL PRIVATE NET WORK) ප්‍රතිස්ථාපනය කිරීම.

| | | | | |
|---|---|---|---|---|
| 1.දික්ඕවිට | 2.මීගමුව | 3.බේරුවල | 4.අම්බලන්ගොඩ | 5.හික්කඩුව |
| 6.ගාල්ල | 7.දෙවුන්දර | 8.මිරිස්ස | 9.කුඩාවැල්ල | 10.හම්බන්තොට |

- වරායන්හි අන්තර්ජාතික ධීවර ඒකකයයන් තුළ කාර්යයෙහි නියුතු නිලධාරීන් 25 ක් පමණ යාත්‍රා නිරීක්ෂණ කටයුතු සඳහා පුහුනු කිරීම.
- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය හරහා යාත්‍රා නිරීක්ෂණ අංශයේ නිලධාරීන්ට වැඩිදුර පුහුනු ලබාදීම.
- ප්‍රයෝගිකව නීති උල්ලංඝනය කර ඇති යාත්‍රා වලට එරෙහිව නඩු පැවරීම 1996 අංක 2 දරණ සංශෝධිත පනත අනුකුලව සිදු කරනු ලබයි .

### 7.4.2. 2017.01.01 සිට 2017.12.31 දක්වා කාල පරාසය තුල යාත්‍රා නිරීක්ෂණ උපකරණ සම්බන්ධ පැමිණිලි

| අනුඅංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | **යාත්‍රා නිරීක්ෂණ උපකරණ පැවරීම.** | 38 |
| 02 | **යාත්‍රා නිරීක්ෂණ යන්ත්‍ර ආපසු භාරදීම්.** | 05 |

## 7.4.3. දෛනිකව සෑම පැය හතරකට වතාවක් යාවත්කාලීන තොරතුරු ලබාගැනීම සහ වාර්තාකරණය.

දෛනිකව සෑම පැය හතරකට වතාවක් යාවත්කාලීන තොරතුරු ලබාගැනීම තුලින් යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් 2017.01.01 සිට 2017.12.31 දක්වා කාල පරාසය තුල යාත්‍රා නිරීක්ෂණ උපකරණයේ ඇති බැටරිය විසන්ධි කරනු ලැබූ යාත්‍රා පිළිබඳව හා දේශ සීමා උල්ලංඝනය කරනු ලැබූ යාත්‍රා පිළිබඳව වාර්තාවීම් සහ ආපදා සංඥා පරීක්ෂාව මගින් වාර්තාවූ අනතුරට පත් යාත්‍රා පිළිබඳ ප්‍රගතිය .

| අනුඅංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | **යාත්‍රා නිරීක්ෂණ උපකරණයේ ඇති බැටරිය ක්‍රියා විරහිත වීම** | **985** |
| 02 | **වෙනත් රටවල මුහුදු සීමා උල්ලංඝනය කිරීම්** | **54** |
| 03 | **ආපදා සංඥා පරීක්ෂාව මගින් වාර්තාවූ අනතුරට පත් යාත්‍රා** | **74** |

## 7.4.4. 2017.03.21 දින සිට 2017.12.31දක්වා එක් එක් වරායෙන් පිටත් වූ ධීවර යාත්‍රා සඳහා ලබා දුන් පිටත්වීම් ගණන.

මෙහි දී පවත්නා නීතිවලට අනුකූලව, යාත්‍රාවේ අතීත ධීවර ගමන් වාර්තා පිළිබඳ අධ්‍යනය කර එක් එක් යාත්‍රාව සඳහා එම ගමන් වාරයට අදාලව VMS පිටවීමේ කේතය නිකුත් කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත.

| | වරාය | පිටත්වීම් ගණන |
|---|---|---|
| 1 | කල්පිටිය | 05 |
| 2 | මීගමුව | 856 |
| 3 | දික්ඕවිට | 1051 |
| 4 | බේරුවල | 2131 |
| 5 | අම්බලන්ගොඩ | 490 |
| 6 | හික්කඩුව | 120 |
| 7 | ගාල්ල | 1655 |
| 8 | මිරිස්ස | 796 |
| 9 | දෙවිනුවර | 1499 |
| 10 | කෝට්ටෙගොඩ | 281 |
| 11 | නිල්වැල්ල | 250 |
| 12 | කුඩාවැල්ල | 1722 |
| 13 | තංගල්ල | 458 |
| 14 | හම්බන්තොට | 166 |
| 15 | කිරින්ද | 29 |
| 16 | ඔලුවිල් | 36 |
| 17 | වාලච්චේන | 95 |
| 18 | ත්‍රිකුණාමළය | 1187 |
| 19 | පොයින්ට්පේද්‍රු | 02 |

**7.4.5. පෙ.ව. 7.00, ප.ව. 2.00 සහ ප.ව. 10.00 ට පහත සඳහන් තොරතුරු යටතේ වාර්තා ලබාගැනීම.**

| වාර්තාව | වෙලාව | සංඛ්‍යාව |
|---|---|---|
| (HARBOUR ARRIVELS)<br>(ධීවර යාත්‍රා වරායට පැමිණීම පිළිබඳ වාර්තාව සහ එක් එක් බෝට්ටුවේ සිතියම් ලබාගැනීම) | පෙ.ව. 7.00<br>ප.ව. 2.00<br>ප.ව. 10.00 | වාර්තා 03 |
| (48 KM BUFFER ZONE)<br>(කිලෝ මීටර් 48 ක් ඇතුලත වරාය සීමාවට ළඟාවන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තාව ලබාගැනීම) | පෙ.ව. 7.00<br>ප.ව. 2.00<br>ප.ව. 10.00 | වාර්තා 03 |
| (BORDER CROSSING )<br>(දේශසීමාව උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තාව ලබාගැනීම) | පෙ.ව. 7.00<br>ප.ව. 2.00<br>ප.ව. 10.00 | වාර්තා 03 |
| (DEPARTURE VESSELS REPORT)<br>(වරායෙන් පිටත් වෙන ලද ධීවර යාත්‍රා පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |
| (BATPO REPORT)<br>(බැටරි විසන්ධි කිරීම් පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |
| (POWER DOWN REPORT)<br>(බැටරිය විසන්ධි වී දින දෙකකට පසු එහි ඇතුලත ඇති බැටරියේ ද විසන්ධිවීම් පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |
| (POWER UP REPORT)<br>(නැවත බැටරිය යථා තත්වයට පැමිණීම පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |
| (SILENT VESSELS)<br>(කාල පරාසයක් තුල ක්‍රියා විරහිතව ඇති යාත්‍රා පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |
| (MISSING DATA REPORT)<br>(සුළු කාල පරාසයක් තුල ක්‍රියා විරහිතව ඇති යාත්‍රා පිළිබඳ වාර්තාව ලබාගැනීම) | ප.ව 2.00 | වාර්තා 01 |

# 8. කිවුල්දිය ධීවර කළමණාකරණ අංශය

## 8.1 අරමුණ

ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරය දායාද කොටගත් කලපු හා මෝය 116 ක් පවතී. මෙම කිවුල් දිය ජලාශ රටේ ආහාර සුරක්ෂිතතාවය වෙත දායකත්වය ලබා දෙමින් හා සිය ගණනක් වූ කලපු ආශ්‍රිත ධීවර ප්‍රජාවන් වෙත ජීවනෝපාය සලසාලමින් දිවයිනේ වෙරළබඩ ප්‍රදේශ සහ ප්‍රජාවන් අතිශය ස්වභාවික සංසිද්ධීන්ගෙන් ආරක්ෂා කරයි.

ශ්‍රී ලංකාව පුරා විසිරි පවතින කලපු පරිසර පද්ධති ආශ්‍රිත ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරණය හා කලපු පරිසර පද්ධතිවල සංවර්ධනය මෙහි ප්‍රධාන අරමුණුවේ.



## 8.2. කාර්යය භාරය

- කළපු පරිසර පද්ධති ආශ්‍රිත ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරනය හා පාලනය
- කළපු පරිසර පද්ධතිය ආශ්‍රිතව කළමණාකරන ප්‍රදේශ නම් කිරිම
- ප්‍රාදේශීය මට්ටමේ කළපු කළමණාකරන ප්‍රදේශ වල ධීවර කමිටු පිහිටුවීම
- ධීවර සහ සහාගීත්ව කළමණාකරන කමිටු පිහිටුවීම හා කළපුවල ජලජ සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා ධීවර කළමනාකරන හා සංවර්ධන සැලැස්ම සකස් කිරිම හා අධීක්ෂණය
- කලපු ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ තොටුපල සංවර්ධනය
- කලපු ධීවරයින්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කලපු ආශ්‍රිත මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරිම, ජලජීවි වගාව
- කලපු ආශ්‍රිතව සිදු වන වන විනාශ, අනවසර ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම් ඇතුළු අනෙකුත් අනවසර කටයුතු පාලනය සම්බන්ධව ක්‍රියාකිරිම හා විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම
- කලපු ධිවර කටයුතු පිලිබඳ පාරම්පරික දැනුම පිලිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ඒවා කලපු කළමනාකරණය සඳහා යොදාගැනීම සම්බන්ධ සැලසුම් සැදීම
- කාලින අවශ්‍යතාවයන්ට අනුව කලපු පද්ධතිය සංරක්ෂණය, සංවර්ධනය සහ නියාමනය සඳහා වන නීති රෙගුලාසි සකස් කිරීම සඳහා කටයුතු කිරීම

## 8.3 2017 වසරේ ප්‍රගතිය

### 8.3.1. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

කලපු පරිසර පද්ධතිය විශේෂිත පරිසර පද්ධතියක් ලෙස සලකා සංවර්ධනය කිරීම සහ සංරක්ෂණය අරමුණු කර ගනිමින් කලපුව ආශ්‍රිත ධීවර ප්‍රජාව කලපු පරිසර පද්ධතියේ වටිනාකම, පරිසර පද්ධතියට සිදුවී ඇති බලපෑම්, කලපුව සංවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හා යෝජනා පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

| ධීවර දිස්ත්‍රික්කය | කලපුව | වැඩසටහන් ගණන | සහභාගිවූවන් ගණන |
|---|---|---|---|
| තංගල්ල | රැකව කලපුව | 01 | 60 |
| කල්මුනේ | පානම කලපුව | 01 | 60 |
| පුත්තලම | මුන්දලම කලපුව | 02 | 60 |
| මඩකලපුව | මඩකලපුව | 01 | 60 |
| මුලතිව් | නන්දිකඩාල් කලපුව | 01 | 60 |
| | නයාරු කලපුව | 01 | 60 |
| මීගමුව | මීගමුව කලපුව | 01 | 60 |
| ගාල්ල | කොග්ගල කලපුව | 01 | 60 |
| හලාවත | හලාවත කලපුව | 01 | 60 |
| ත්‍රිකුණාමලය | කෝකිලායි කලපුව | 01 | 60 |

### 8.3.2. ධීවර පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ වැඩසටහන

ධීවර පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ වැඩසටහන යටතේ වෙරළාශ්‍රිත ධීවර ප්‍රජාව සඳහා ප්‍රතිලාභීන් 2877 ක් සඳහා වැසිකිලි සඳහා ආධාර ලබා දෙන ලදී.

## 8.3.3. වැවක් සමග ගමක් සංවර්ධන වැඩසටහන - 2017

වෙරළබඩ සහ කලපු ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් ලබාදීම, තෝරාගත් ගම්මාන 15 ක් ආශ්‍රිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදි සිදුකරන ලද වැඩසටහන් සාරාංශය පහත දැක්වේ.

දිස්ත්‍රික්කය - පුත්තලම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - හලාවත
ගම්මානය - මැරවල

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| මැරවල හරින්ද ප්‍රදේශයේ මාර්ගය කොන්ක්‍රිට් ගල් දමා සැකසීම. (දිග මී. 52) | 50 | 399,979.76 |
| මැරවල ජනපදයේ පළමු පටුමගේ වොලිබෝල් ක්‍රීඩා පිටිය අසලින් ආරම්භ වන මාර්ගය කොන්ක්‍රිට් ගල් දමා සැකසීම. (දිග මී. 116) | 50 | 899,971.93 |
| හරින්ද ප්‍රදේශයේ තොටුපල සංවර්ධනය | 10 | 228,500.00 |
| ඇන්ටනී බර්නාඩ් මහතාගේ නිවස අසල නව තොටුපල සංවර්ධනය | 15 | 400,000.00 |
| සනී කැමිලස් මහතාගේ නිවස අසල නව තොටුපල සංවර්ධනය | 15 | 400,000.00 |
| හලාවත කලපුවේ තිලාපියා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම | 200 | 112,160.00 |



මැරවල හරින්ද ප්‍රදේශයේ මාර්ගය කොන්ක්‍රිට් ක්‍රීඩා පිටිය ගල් දමා සැකසීම කොන්ක්‍රිට් ගල් දමා සැකසීම



මැරවල ජනපදයේ පළමු පටුමගේ වොලිබෝල් අසලින් ආරම්භ වන මාර්ගය



හරින්ද ප්‍රදේශයේ තොටුපල සංවර්ධනය සංවර්ධනය



ඇන්ටනී බර්නාඩ් මහතාගේ නිවස අසල නව තොටුපල

දිස්ත්‍රික්කය - පුත්තලම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - කල්පිටිය
ගම්මානය - වන්නිමුන්දලම

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| බහු කාර්යය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය | 360 | 1,935,000.00 |
| වන්නිමුන්දලම තොටුපලේ ධීවර යාත්‍රා නවතා තැබීම සඳහා අව්ආවරණ ඉදිකිරීම | 60 | 400,000.00 |
| වන්නිමුන්දලම තොටුපල බොරළු දමා සංවර්ධනය | 360 | 1,000,000.00 |
| වෙරල පාර කොන්ක්‍රීට් කිරීම(දිග මී.188) | 468 | 1,735,000.00 |

දිස්ත්‍රික්කය - මඩකලපුව
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - කෝරලෙයිපත්තු උතුර
ගම්මානය - පනිච්චන්කර්නි

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| කොලනි පාර ගල් දමා සැකසීම (දිග මී.222) | 734 | 500,000.00 |
| සල්ලිතිවු මාර්ගය කොන්ක්‍රීට් කිරීම(දිග මී. 39.5) | 734 | 500,000.00 |
| කෝවිල්කුඩියිරුප්පු පාර ගල් දැමීම(දිග මී.165) | 734 | 400,000.00 |
| බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 734 | 2,000,000.00 |

දිස්ත්‍රික්කය - ත්‍රිකුණාමලය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - කුච්චවේලි
ගම්මානය - සාගරපුර

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| බහු කාර්ය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා විදුලිය ලබා දීම | 100 | 619,609.20 |
| පානීය ජල ව්‍යාපෘතිය | 120 | 1,029,318.62 |
| ප්‍රධාන මාර්ගයේ සිට සාගරපුර තොටුපල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම (දිග මී.100) | 150 | 1,129,505.16 |

දිස්ත්‍රික්කය - කිලිනොච්චි
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - පච්චිලායිප්පල්ලි
ගම්මානය - කිලාලි

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| පොදු ගොඩනැගිලි පාර තාර දමා සකස් කිරීම (දිග කි.මී.1.5) | 80 | 3500000.00 |

දිස්ත්‍රික්කය - මන්නාරම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - මන්නාරම
ගම්මානය - ඉරුක්කලම්පිඩ්ඩි

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| වෙරල පාර තාර දමා සකස් කිරීම( දිග මී.700) | 1200 | 2,000,000.00 |



පොදු ගොඩනැගිලි පාර තාර දමා සකස් කිරීම (දිග කි.මී.1.5)



වෙරල පාර තාර දමා සකස් කිරීම( දිග මී.700)

දිස්ත්‍රික්කය - හම්බන්තොට
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - හම්බන්තොට, තංගල්ල
ගම්මානය - පල්ලෙමලල, කුඩාවැල්ල උතුර, පහජ්ජාව

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල්. |
|---|---|---|
| නාලාන්දාරාමය විහාරස්ථානය අසල ඇති වැව ප්‍රතිසංස්කරණය කිරීම | 50 | 4,113,248.48 |
| පල්ලෙමලල කැටයම් කඩය අසල මාර්ගය කැට ගල් අල්ලා සංවර්ධනය කිරීම (දිග මී.140) | 150 | 1,497,589.62 |
| ඇල්බට් ගලප්පත්ති මහතාගේ නිවස අසල මාර්ගයේ කැටගල් අල්ලා සංවර්ධනය කිරීම (දිග මී.170) | 100 | 1,933,398.13 |
| පල්ලෙමලල වයි.ජී.ලයනල් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම(දිග මී.150) | 110 | 1,380,813.17 |
| පල්ලෙමලල කිරිපට්ටිය සයිමන් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම (දිග මී.164) | 100 | 1,498,780.37 |
| පල්ලෙමලල- එස්.පී.බන්දුවතී මහත්මියගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය සංවර්ධනය කිරීම (දිග මී.92) | 50 | 855,474.49 |
| පොල්පිටිය අසල කාණු පද්ධතිය ඉදි කිරීම(දිග මී. 60) | 500 | 443,416.36 |
| කුඩා වැල්ල කලපුගොඩ මහවෙල පිවිසුම් මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම(දිග මී. 90) | 250 | 1,819,785.70 |
| සහන් විමන දෙවන හරස් මාර්ගයේ කාණු පද්ධතිය ඉදි කිරීම(දිග මී.250) | 200 | 1,857,398.50 |
| දෙද්දුවාවල මාර්ගයේ කාණු පද්ධතියේ ඉතිරි කොටස නිම කිරීම(දිග මී.138) | 250 | 999,999.50 |
| පළවන හරස් මාර්ගයේ කාණු පද්ධතිය ඉදි කිරීම(දිග මී.150) | 300 | 1,068,812.16 |

දිස්ත්‍රික්කය - මාතර
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වැලිගම
ගම්මානය - ගරාඩුව

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රුපියල් |
|---|---|---|
| මල්ගහ තොටුපලට ඇති පාර කොන්ක්‍රීට් කිරීම ( දිග මී.50) | 300 | 469,351.28 |
| මල් ගහ තොටුපල අසල ඇති ප්‍රජා ශාලාව අලුත්වැඩියා කිරීම | 300 | 43,530.52 |

දිස්ත්‍රික්කය - කළුතර
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - කළුතර
ගම්මානය - කටුකුරුන්ද

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| කලපුවෙන් තොටුපලට වන පාර කොන්ක්‍රීට් කිරිම ( දිග මී. 394) | 150 | 1,327,500.00 |

දිස්ත්‍රික්කය - මුලතිව්
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - මැරිටයිම්පත්තු
ගම්මානය - නයාරු

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| අලම්පිල්-කුමුලමුනෙ මාර්ගය අලුත්වැඩියාව(දිග මී.565) | 600 | 1,000,000.00 |

දිස්ත්‍රික්කය - යාපනය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - චාවකච්චේරි
ගම්මානය - කෙට්පාලි

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| බෝට්ටු නවතා තැබීම සඳහා විවෘත අංගනයක් ඉදිකිරිම | 204 | 2,000,000.00 |



බෝට්ටු නවතා තැබීම සඳහා විවෘත අංගනයක් ඉදිකිරිම

දිස්ත්‍රික්කය - ගාල්ල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - හබරාදූව
ගම්මානය - ගොඩවත්ත

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| තිඹිරිගහ දූව පාර තාර දමා සකස් කිරීම | 2100 | 370000.00 |
| හරුමල්ගොඩ නැගෙනහිර කණිෂ්ඨ විද්‍යාලය ඉඩම වටා කොන්ක්‍රීට් හා දැල්වලින් සකස් කරන ලද වැට ප්‍රතිසංස්කරණය කිරීම | 142 | 1838550.00 |

**8.3.4. වැවක් සමග ගමක් ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | සකස් කල කූඩු ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| මඩකලපුව පනිච්චන්කර්නි හි කකුළුවන් තර කිරිම | 24 | 24 |
| ගාල්ල ගොඩවත්ත ගම්මානයේ කකුළුවන් තර කිරිම | 04 | 04 |
| ගාල්ල ගොඩවත්ත ගම්මානයේ පාද සම්භාහන මධ්‍යස්ථානයක් ඇති කිරිම | 01 | 01 |
| මාතර ගරාඩුව හි කකුළුවන් තර කිරිම | 04 | 04 |
| මන්නාරම ඉරුක්කලම්පිඩ්ඩි හි මුහුදු පැළෑටි වගාව | 10 | 10 |
| මන්නාරම ඉරුක්කලම්පිඩ්ඩි හි මොදා වගාව | 12 | 12 |
| කල්මුනේ ආරුගම්බේ එළුවන් ඇති කිරිම | | 20 |

**8.3.5. කලපු කළමනාකරණ ප්‍රදේශ සලකුණු කිරීම , ධීවර කමිටු පිහිටුවීම හා ධීවර කළමනාකරණ සහසහභාගිත්ව කමිටු පිහිටුවීම**

පුත්තලම කලපුවේ සීමාව ජී.පි.එස්. පාඨාංක සහිත සලකුණු කරන ලද අතර පුත්තලම ධීවර සහසහභාගිත්ව කමිටුව පිහිටුවන ලදී.

තංගල්ල ධීවර දිස්ත්‍රික්කයට අයත්වන රැකව කලපුව, මාවැල්ල කලපුව, මලල අම්බිලිකල කලපුව හා බුන්දල කලපුව යන කලපු සඳහා ධීවර කමිටු පිහිටුවීම හා සහසහභාගිත්ව කමිටුව පිහිටුවන ලදී.

# 9. පාලන අංශය

## 9.1. අරමුණ.

දෙපාර්තමේන්තුවේ අරමුණු මුදුන්පත් කර ගැනිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වන මිනිස් බල සම්පත්, ගොඩනැගිලි පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ජලය, විදුලිය, සනීපාරක්ෂක හා සන්නිවේදන පහසුකම් සම්පාදනය සහ මානව සම්පත් කළමනාකරණය, ගොඩනැගිලි, වාහන හා අනෙකුත් පහසුකම් මනාව නඩත්තු කර යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම මෙම අංශයේ අරමුණ වේ.

## 9.2. කාර්යයන්.

- අවශ්‍ය වන මිනිස් බල සම්පත් සැපයුම් ඇස්තමේන්තු කිරිම, රැකියා පිරිවිතර හා බඳවා ගැනීමේ පරිපාටි සකස් කොට අනුමැතිය ලබාගැනීම හා මානව සම්පත් සපයා ගැනීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය බඳවා ගැනිම, සේවය ස්ථිර කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම, සේවා අන්තර් ග්‍රහණය කිරීම, උසස්වීම් ලබාදීම, සේවයෙන් මුදාහැරීම හා විශ්‍රාම ගැන්වීම යන සියළුම ආයතනික කටයුතු මෙහෙයවා පවත්වා ගැනිම.
- දීප ව්‍යාප්ත සේවා හා ඒකාබද්ධ සේවා කාර්ය මණ්ඩලය ස්ථාන මාරු මගින් ලබාගැනිම, සේවය ස්ථිර කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විභාග සඳහා යොමු කිරීම, වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම, උසස්වීම්, සේවයෙන් මුදාහැරීම හා විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ ලබාදීම යන සියළුම ආයතනික කටයුතු මෙහෙයවා පවත්වා ගැනිම.
- මූලික විමර්ෂණ හා විනය පරීක්ෂණ ඇතුළු කාර්ය මණ්ඩල විනය කටයුතු පවත්වාගෙන යාම.
- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන ලද සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම.
- ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ ලබා දුන් යතුරු පැදි අදාල නිලධාරින්ට පවරාදීම
- දේශීය හා විදේශීය අධ්‍යයන, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා කාර්යමණ්ඩලය සහභාගි කරවීම.
- සන්නිවේදන පහසුකම් සම්පාදනය හා ඊට අදාල ගෙවීම් කටයුතු.
- කාර්ය මණ්ඩල සේවයට වාර්තා කිරීම පසුවිපරම, නිවාඩු ගැන්වීම හා වාර්තා පවත්වාගෙන යාම.
- දුම්රිය ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම හා ඊට අදාල ගෙවීම් කටයුතු.
- කාර්ය මණ්ඩලය සඳහා අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම් කටයුතු.
- ප්‍රධාන කාර්යාලයට ලැබෙන තැපැල ලේඛණගතව බෙදාහැරීම.
- ප්‍රධාන කාර්යාලයෙන් යවන සාමාන්‍ය තැපැල ලේඛණ පවත්වා ගැනීම හා ඊට අදාල ගෙවීම් කටයුතු.
- දිස්ත්‍රික් කාර්යාල සඳහා තැපැල් වියදම් වෙන් කිරීම හා ඊට අදාල ගෙවීම් කටයුතු.
- කාර්යාල කුළියට ගැනීම, කාර්යාල කුලී හා වරිපනම් බදු ගෙවීම හා වාර්තා පවත්වාගෙන යාම.
- නිළ නිවාස කාර්ය මණ්ඩලයට ලබා දීම, නිවාස කුලී අයකිරීම හා වාර්තා පවත්වාගෙන යාම.
- සංචාරක බංගලාව කුලීයට ලබාදීම, කුලී අයකිරීම, නඩත්තුව හා වාර්තා පවත්වාගෙන යාම.
- සේවක මණ්ඩලය විසින් ඉල්ලුම් කළ විවිධ ණය අත්තිකාරම් ගෙවිම සඳහා අනුමැතිය ලබාදීම.
- ණය සම්බන්ධ වාර්තා පවත්වාගෙන යාම, හිග ණය ශේෂ අයකර ගැනීම හා කපා හැරීම.
- වාහන අලුත්වැඩියාව, සේවා කිරීම, රාජ්‍ය ලාංඡන යෙදීම, ඉන්ධන, බැටරි, ටයර් හා ටියුබ් නිකුත් කිරීම.
- වාහන අපහරණය, වාහන බාරදීම, වාහන ලබා ගැනීම, වාහන වෙන් කිරීම හා ලියාපදිංචි කිරීම.
- ධාවන සටහන් නිවැරදිව ලිවීම පසුවිපරම හා වාහන සම්බන්ධ වාර්තා පවත්වාගෙන යාම.
